වෘත්තීය මාර්ගෝපදේශ අධ්‍යාපනික සහ තොරතුරු සංග්‍රහය

33 කලාපය 2015

# හසර

පුවත්පතක් ලෙස ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී



කම්කරු අමාත්‍යාංශයේ

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි




# ජීවිතයට පාට දෙන්න...

සිතක ඉපදෙන
නැවුම් සිතුවිලි
දකින්නට බැරි
සිහින සිතුවිලි
ඇඟිලි තුඩුවල
දවටිලා චිත්
ලොවක් මවනා
අසිරි සිරි
විසල් ලොව තුළ
සිතුම් කැටිකර
නොයෙක් පැහැසර
මැවෙන රූ සිරි
නව ලොවක් මත
පාට වන්නට
දූ පුතුන් හට දෙන්න දිරි

- ඒරන්දතී රන්දෙනිය -

# හසර

**උපදේශකත්වය**

එච්.ජී.ජී.ජේ. ධර්මසේන
අධ්‍යක්ෂ ජනරාල්
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

**මෙහෙයවීම**

මාධවී නිසංසලා ගුණවර්ධන
අධ්‍යක්ෂ

චේතනා ජයමාලි
සහකාර අධ්‍යක්ෂ
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

**සංස්කරණය**

චිරන්දතී රන්දෙනිය

**පිටකවරය**

විජිත බණ්ඩාර

**පරිගණක පිටු සැලැස්ම**

තුසිත ලොකුගේ

**ප්‍රකාශනය**

රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා
වෘත්තීය මාර්ගෝපදේශ අංශය,
මිනිස්බල හා රැකීරක්ෂා
දෙපාර්තමේන්තුව,
කම්කරු අමාත්‍යාංශය

**මුද්‍රණය**

සෙව්කෝ ප්‍රින්ටින් ඇන්ඩ් පැකේජින්
පුද්ගලික සමාගම,
28 බී, කටුවාවල, බොරලැස්ගමුව
0112 -518711

**ISSN 1391-622X**


## පෙළ ගැස්ම


01) සංස්කාරක සටහන — 02

02) වැඩ ලොවට අවශ්‍ය නිර්මාණශීලී චින්තනය — 03

03) නිර්මාණකරණයට ඔබ සූදානම් ද ? — 06

04) මෝස්තර නිරූපණය — 08

05) පරිසරයේ හැඩතලයන් ගොඩනැගීමේ අපූරු නිර්මාණශීලී හැකියාවක් ඔබ සතු ද ? — 11

06) විකසිත මලක් — 14

07) නව නිපැයුම් කළමනාකරණය — 16

08) නිර්මාණශීලි හා ඵලදායි සේවකයින් බිහිවීමට මඟ පාදන සේවක අභිප්‍රේරණය — 19

09) සංචාරක මාර්ගෝපදේශනය — 22

10) හදවත සනසන හිතමිතුරු සේවය - ශ්‍රී ලංකා සුමිත්‍රයෝ — 25

11) ජාතික මෝස්තර මධ්‍යස්ථානය — 27


හසර : මාර්ගය, මාවත, පිළිවෙල, උපාය ක්‍රමය, හැසිරීම

අරුත් ගැන්වීම : මහාචාර්ය ඒ. ඒ. අබයසිංහ
ආචාර්ය නිමල් පරවාහැර

## සංස්කාරක සටහන



# නිර්මාණශීලීත්වයට ඉඩ දෙන්න....

මෙලොව වසනා අප කාටත් නිර්මාණශීලිත්වය යන්න නුහුරු දෙයක් නොවේ. මන්ද අප කා තුළත් එය ඇති බැවිනි. මේ ලෝකය මෙතරම් සුන්දර වී ඇත්තේ නිර්මාණශීලිත්වය ඇති මිනිසුන් නිසාවෙනි. ඒ අයගේ නිර්මාණ පිළි ගන්නා මිනිසුන් නිසාවෙනි. ලෝකය මෙතරම් දුර යන්නේද මේ නිසාමය. යම් දිනක මේ ලොව වැනසෙන්නේද මේ නිසාමය. එසේ නම් අපට ඉන් මිදිය නොහැකිය. කළ හැකි එකම දෙය නම් මේ නිර්මාණශීලිබව මිනිසුන්ගේ හදවත් සනසන්නට හැකි මෙලොව තවත් ලස්සන කළහැකි නිර්මාණ වෙතට යොමු කිරීමයි. ඒ සඳහා ලෝකය තවත් ඉදිරියට ගෙන යා හැකි නිර්මාණශීලී සුන්දර මිනිසුන් බිහිවිය යුතුයි. එවැනි පුද්ගලයින් බිහිවීමට නම් ඊට අප සැමගේ දායකත්වය අවශ්‍යයය. දෙමාපියන්, වැඩිහිටියන්, ගුරුවරුන් ආදී සමාජයේ ජීවත්වන පුද්ගලයකු ලෙස මේ වෙනුවෙන් අපට කළ හැකි දෑ බෙහෝය.

දරුවකු නිර්මාණශීලිවන්නේ සහජ දක්ෂතාවයෙන් පමණක්ය යන්න නිවැරදි වන්නේ නැත. නිර්මාණශීලීත්වය දරුවෙකුට ඇති කළ හැකි කුසලතාවයකි. ඊට තුඩුදෙන පරිසරයක් දරුවාට ලබාදීම වැඩිහිටියන්ගේ යුතුකමකි. එය මිල මුදල් හෝ බඩු භාණ්ඩ මත තීරණය වන්නක් බව කිසිසේත් සිතිය යුතු නැත. දරුවන්ගේ නිමාණශීලි පරිකල්පනය ඇති කළ හැකි මාර්ග මේ සොබාදහම තුළ ඕනෑ තරම් ඇත. කල යුත්තේ අප ඒවා හඳුනාගෙන දරුවාට ඊට සමීප වීමට අවශ්‍ය ඉඩ ලබා දීමයි. අදාල කුසලතා දියුණු කිරීමට අත දීමයි.

විශේෂයෙන්ම කුඩා දරුවෙක් වේවා වෙනත් අයෙක් වේවා නිර්මාණශීලී ලෙස යම් කටයුත්තක නියැලේ නම් එය අගය කිරීමටත් ඊට හානි නොවන ආකාරයේ විවේචන පමණක් කිරීමටත් අප පුරුදු විය යුතුමය. සමාජයේ බොහෝ දෙනා පුරුදු වී ඇත්තේ වෙනස් ආකාරයට සිතනා අයකු අපහසුවට පත් කිරීම හා උපහාසයට ලක් කිරීමයි. එසේම බහුතරයේ අදහසම කරපින්නා සිටීමයි. එසේ වුවත් ලොවට හානි නොවන නව සිතුම් පැතුම් එළි දක්වන්නන්ට ඊට අනුබල නොදේනම් කෙදිනකවත් ඒවා මේ රට සංවර්ධනයට යෙදවෙන්නේ නැත. නිර්මාණශීලී හැකියාව අඩු නම් අඩුම තරමේ එය කරනා මිනිසුන් දිරි ගැන්වීමත් වෙනස් වූ ලොව සමඟ අත්වැල් බැඳ ගැනීමත් අප සතු යුතු කමකි.



**- එරන්දතී රන්දෙනිය -**

# වැඩ ලොවට අවශ්‍ය නිර්මාණශීලී චින්තනය



වරක් ඩේල් කානගී නැමති ලේඛකයා ප්‍රකාශ කළේ "එක වගේ මිනිසුන් අතර නැහැයක් දුර ඉදිරියට යන්න" යනුවෙනි. මෙහි අර්ථය වනුයේ එකවගේ මිනිසුන් අතර ඔබ පොඩ්ඩක් අනෙකාට වඩා ඉදිරියට යා යුතු බවයි. නැතිනම් වෙනස් විය යුතු බවයි. එම වෙනස යහපත් දෙසට වූ වෙනසක් නම් තරගකාරී ආර්ථිකය තුළ ඔබට අන්‍යතාවයක් ගොඩ නැගීම හරහා වටිනාකමක් නිර්මාණය කර ගත හැකිය. නැතහොත් ඉඩ කඩක් වෙන් කර ගත හැකිය. නමුත් එක වගේ මිනිසුන් අතර මෙම වෙනස ඇති කර ගැනීමට නම් ඔබ තුළ නිර්මාණශීලී භාවය පැවතිය යුතුය.

**කුමක්ද මේ නිර්මාණශීලීභාවය යනුවෙන් අදහස් වන්නේ ?**

ඉතා සරලව පැහැදිලි කරන්නේ නම්, පවතින දේවල් දෙස වෙනස් ආකාරයෙන් බැලීමේ හැකියාව හෝ පවත්නා දේ නව ආකාරයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව අපට නිර්මාණශීලීත්වය ලෙස ප්‍රකාශ කරන්න පුළුවන්. එය නව්‍යතාවයකි, වෙනසකි. මෙසේ වූ නිර්මාණශීලී මිනිසුන්ට ව්‍යාපාරික ලෝකය තුළ නිතැතින්ම විශේෂිත ඉඩකඩක් වෙන් වේ. වෘත්තීය සාර්ථකත්වය සඳහා වේවා, ව්‍යාපාරික ජයග්‍රහණය උදෙසා වේවා, නවෝත්පාදන බිහි කිරීම සඳහා වේවා, නිර්මාණශීලී චින්තනය අත්‍යාවශ්‍ය කාරණයකි.

අපි මෙය උදාහරණයකින් පැහැදිලි කර ගනිමු. ඔබ යම් කිසි ආයතනයකට අයදුම්පතක් යොමු කරනවා යැයි සිතමු. එම තනතුර සඳහාම තවත් දහසක් දෙනා අයදුම් කරනු ඇත. මේ සියලු අයදුම්පත් යොමු වන්නේ එම ආයතනයේ එක් සාමාන්‍ය සේවක මහතකු වෙත විය හැකිය. දැන් පැමිණි අයදුම්පත් අතුරින් ඔබේ අයදුම්පත ප්‍රමුඛ වීමට නම් ඔබේ අයදුම්පත සෙසු අයදුම්පත් අතුරින් වෙනස් විය යුතුය. එසේ කරන්නට ඔබට නිර්මාණශීලීව සිතන්නට සිදු වේ. එක සමාන අයදුම්පත් බහාලුම් අතරින් ඔබේ අයදුම්පත තෝරා ගන්නට සිතෙන ලෙස ලියුම් කවරය ආකර්ශනය කර ගැනීමේ තරගයේ සිට සම්මුඛ පරීක්ෂණයෙන් තේරීම දක්වාත්, ඉන් අනතුරුව සමාන කාර්ය මණ්ඩල සාමාජිකයන් අතර කැපීපෙනෙන අයෙක් වීම සඳහාත්, මුහුණ දීමට සිදු වන අභියෝග ජයග්‍රහණය කිරීම සදහාත් ඒ සෑම දෙයක් දෙසම නිර්මාණශිලීව බැලීම අත්‍යාවශ්‍ය වේ. එකම සුදුසුකම් ඇති එකම වයසේ අය අතර ඔබ සුවිශේෂී අයකු වීමට නම් ඔබ සෙස්සන්ට වඩා නිර්මාණශිලී විය යුතුය. එය කරන්නට ඔබට වෙනස් ආකාරයකින් බැලීමේ හැකියාව ඇති විය යුතුය.

බොහෝ විට අපට වැඩ ලෝකයේදී හමුවනුයේ සාම්ප්‍රදායික චින්තනයෙන් යුතු වෙනස් වීමට අකමැති සිය අයිතිවාසිකම් හා වරප්‍රසාද ගැන පමණක් සිතන පිරිස්ය. මේ සියල්ල පසෙකලා ඔබට නිර්මාණශීලී අයකු විය හැකි නම්, ඔබට බොහෝ දේ ජීවිතයට ළඟා කර ගැනීමේ හැකියාව ව්‍යාපාරික ලෝකය තුළ පවතී.

ලොව ඕනෑම ව්‍යාපාරයක් යනු මිනිසුන්ගේ පවත්නා ප්‍රශ්නවලට සොයන ලද නිර්මාණශීලී පිළිතුරක ප්‍රතිඵලයකි. නිර්මාණශීලී චින්තනය ව්‍යාපාරික අවස්ථා උදා කරයි. ඇස් පෙනීම දුර්වල වීම යන ප්‍රශ්නයට ලැබුනු නිර්මාණශීලී පිළිතුර උපැස් යුවළයි. පයින් ඇවිදීමේදී යටිපතුල් වලට ඇති වන වේදනාව නැමති

ප්‍රශ්නයට ලැබුනු නිර්මාණශීලී පිළිතුර පාවහන් යුගලයි. මේ ආදී ලෙස නිෂ්පාදන බිහි වන්නේත්, ඒ මත පදනම් වූ ව්‍යාපාර ගොඩ නැගෙන්නේත්, එම නිෂ්පාදන වෙනස් වෙවී ඉදිරියට යන්නේත්, ව්‍යාපාරික ආයතන සාර්ථකත්වය කරා යන්නේත් නිර්මාණශීලී චින්තනයේද ආභාෂය ඇතිවය. නිර්මාණශීලී සිතිවිලි ඇති තරුණයකු මී කුනක් විකුණා සිටුවරයකු වූ කතා පුවතක් බුදු දහමේ එන ජාතක කතා තුළින් අපට හමුවේ. පිළිගත් කිසිදු ආර්ථික සම්පතක් නොමැතිව එහෙත් නිර්මාණශීලී චින්තනයෙන් පමණක් ලොව ජයගත් මිනිසුන් අපට ලොව ඕනෑ තරම් සොයා ගත හැකිය.

දැන් අභියෝගය වන්නේ මෙතරම් අනර්ඝ නිර්මාණශීලී චින්තනය විකසනය කර ගන්නේ කෙසේද යන්නයි. මාගේ සරල අදහස වන්නේ සෑම මිනිසකු තුළම නිර්මාණශීලී චින්තනය අඩු වැඩි වශයෙන් උපතින්ම පිහිටන බවයි. එය හැදෙන වැඩෙන පරිසරය, ඉගෙනුම ලබන පාසල, ඇසුරු කරන මිතුරු මිතුරියන්, ආගමික පසුබිම ආදී කරුණු මත උද්දීපනය වීම හෝ නොවීම සිදු වේ. වරක් පෙර පාසල් ගුරුවරියක් මා සමග බෙදා හදාගත් අත්දැකීමක් මෙහි ලා සටහන් කරමි.

***ඇගේ පෙර පාසලේ කුඩා දරු දැරියන් 22 කු වූ අතර දිනක් ඇය සියලුම දරුවන්ට බැලුම් බෝල අඳිනා ලෙස පැවරුවාය.*** දරුවන් අතරින් 21 දෙනෙකු රතු, නිල් ,කහ ආදී ලෙස තමා දැක ඇති හුරු පුරුදු බැලුන් සුදු කොළ මත ඇන්ද අතර එක් දරුවෙක් පමනක් තමා ඇන්ද බැලුම් බෝලය අතට අසු වූ විවිධ වර්ණවලින් ආලේප




කළාය. දරුවන් නිවෙස් වලට රැගෙන යාමට පැමිණි දෙමව්පියන් දරුවන්ගේ නිර්මාණ දෙස බලා සතුටු වෙත්දී එක් මවක් සිය දරුවාගේ අතින් අල්ලාගෙන ඇදගෙන ගුරුතුමිය වෙත පැමිණ ඇයට දොස් පවරන්න වූයේ "ඇයි ටීචර් මගේ දරුවාට බැලුම් බෝලයක් වත් පාට කරන්නට හරියට කියා දෙන්නවත් බැරිද?" යනුවෙන් අසමිනි. එසේ ගුරුතුමියට පැමිණිලි කළේ එකම බැලුම තුළ විවිධ වර්ණ ආලේප කළ දරුවාගේ මවයි. මාගේ අදහස එම දරුවන් අතර සිටි එකම නිර්මාණශීලී දරුවා ඔහු බවයි. එහෙත් එය ප්‍රකාශ කළ අවස්ථාවේම වැඩිහිටියන් වන අප විසින් එය යටපත් කරනු ලැබීය. අපගේ සමාජය අපව උනන්දු කරනුයේ පවත්වා දේවල් පවත්නා ආකාරයෙන් එලෙසම පිළිගෙන කරගෙන යන්නට මිස නිර්මාණශීලී නව දේවල් කරන්නට නොවේ. එහෙත් තරගකාරී ආර්ථිකය අපෙන් අපේක්ෂා කරනුයේ නිර්මාණශීලී චින්තනයයි. ලොව වෙනස් කරනු ලැබුවේ සාම්ප්‍රදායික ලෙස සිතනා සම්ප්‍රදායික මිනිසුන් නොව සාම්ප්‍රදායෙන් වෙනස්ව සිතනා නිර්මාණශීලී මිනිසුන් විසිනි.

ආර්ථික අපහසුතාවයකින් යුතු තරුණයකු සිය මවට ආර්ථික වශයෙන් ශක්තියක් වීමේ අදහස ඇතිව සිටිනා විටක දිනක සවස් වරුවේ දුටුවේ පාපන්දු පිටියක ක්‍රීඩා කරමින් සිටිනා තරුණ පිරිසකි. ඔහු පිට්ටනියෙන් පිටතට විසිවෙන බෝල අසුලා පන්දු පිටියට විසි කරමින් සවස් වරුව ගත කළ අතර ක්‍රීඩා නිම කොට යන තරුණයින් ඔහුට කාසි කිහිපයක් පිරිනැමීය. එය යම් කිසි ආකාරයක



ආදායම් මාර්ගයක් ලෙස හඳුනාගත් ඔහු සෑම සවසකම මෙය කරගෙන යන්නට විය. මෙය දුටු අසල්වාසී සම වයසේ තරුණයින් ඔහු අනුකරණය කරන්නට විය. තරගය නිර්මාණය විය. නිර්මාණශීලී චින්තනයෙන් යුතු අපගේ කථා නායකයාට සෙස්සන් අතරින් වෙනස් වීමේ අවශ්‍යතාවය ඇති විය. නිර්මාණශීලී චින්තනය මෙහෙයවූ ඔහු වතුර බඳුනක් රැගෙන විත් ක්‍රීඩකයින්ගේ පිපාසයට ජලය රැගෙන විත් විශේෂ වාසි අත් කර ගත්හ. දින කිහිපයකින් සෙස්සෝද එය අනුකරණය කළෝය. යලි තරගය ඇති විය. අපගේ කථානායකයා ජලයට අයිස් එක් කලේ සෙස්සන් අතරින් නහයක් දුර යෑම සඳහායි. මේ ලෙසින් අපටද එක වගේ අය අතර තරමක් හෝ වෙනස් වෙමින් ඉදිරියට යෑමේ අවශ්‍යතාවය පවතී. නිර්මාණශීලී චින්තනය විකසනය කර ගැනීම සඳහා උපකාරී විය හැකි කරුණු කාරණා කිහිපයක් මා ඔබට යෝජනා කිරීමට කැමැත්තෙමි.

### 1. වෙනස් වීමට ඇති කැමැත්ත

ලොව සිටිනා මිනිසුන් වෙනස් වීමට රිසි හා වෙනස් වීමට රිසි නොවන ලෙස මූලික වශයෙන් වර්ගීකරණය කරන්න පුළුවන්. වෙනස් වීමට කැමැති මිනිසුන් විසින් වෙනස් කරනා ලෝකය තුළ වෙනස් වීමට අකමැති මිනිසුන් ජීවත් වීම පමණක් සිදු වේ. ඔබට නිර්මාණශීලී දේ කරන්නට අවශ්‍ය නම් ප්‍රථමයෙන් ඔබ වෙනස් වීමට ඇති කැමැත්ත නොහොත් මානසික සූදානම ඇති කර ගත යුතුය.

### 2. කරනා දෙයට ආදරය කිරීම

වරක් ස්ටීව් ජොබ්ස් ප්‍රකාශ කළේ "ඔබට යමක් සාර්ථකව සිදු කිරීමට අවශ්‍ය නම් ඔබට ආදරය කළ හැකි දෙයක් කරන්න" යනුවෙනි. නැති නම් කරනා දෙයට ආදරය කිරීම ඔබ විසින් ඇරඹිය යුතුය. ඔබ කරනා දෙයට ආදරයක් , ඇල්මක් ,භක්තියක් ඔබ තුළ නැති නම් කිසිදු ලෙසකින් වත් ඔබ තුළ නිර්මාණශීලී අදහස් පහළ වීමේ ඉඩකඩක් නැත.

### 3. අත්දැකීම් බහුල කරගන්න

සිතිවිලි පහළ වන්නේ අපගේ මනස තුළය. මනසේ ක්‍රියාවලි සිතිවිලි ලෙස අපට හඳුන්වන්න පුළුවන්. බිහිවන සිතිවිලිවල නිර්මාණශීලීභාවය තීරණය වන්නේ ඔබ ජීවිතයේ ලබා ඇති අත්දැකීම්වල බාහුල්‍යතාවය අනුවයි. බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව, උසස් නිර්මාණ පරිශීලනය, නැණවතුන්ට සවන් දීම හා සාකච්ඡා සම්මන්ත්‍රණවලට යොමුවීම ඔබේ නිර්මාණශීලී චින්තනය විකසනය කරවයි.



**මොහාන් පල්ලියගුරු**
මානව හැකියා සංවර්ධන පුහුණුකරු හා මනෝවිද්‍යා උපදේශක

### 4. සිහිනයක් දකින්න

ඔබ නිම කළ දෙයක් හෝ ඉදිරියේදී සිදු කිරීමට ඇති සෑම දෙයක්ම ඉටු කිරීමට ඊට වඩා හොඳින් කළ හැකි තවත් ක්‍රමයක් වේදැයි සිතීමට ආරම්භ කරන්න. එක්කෝ එම කටයුත්ත ආරම්භ කිරීමට ප්‍රථම මෙය වඩා හොඳින් කළ හැක්කේ කෙසේද යන ප්‍රශ්නය මනසට යොමු කොට එය සමඟ දින සති කිහිපයක් ජීවත් වන්න. දිය නාන විට, බසයේ යන විට, පාපැදිය පදින විට ආදී ලෙස නොසිතූ මොහොතක ඔබගේ නිර්මාණශීලී චින්තනය අවදි වී ඔබට උත්තර සපයනු ඇත. ඔබ කළ යුත්තේ සටහන් පොතක් හා පෑනක් තබා ගනිමින් එය සටහන් කර ගැනීම පමණි. නොඑසේනම් කටයුත්තක් නිම කළ විගස මෙය මීට වඩා හොඳින් නිම කිරීමට වෙනත් ක්‍රමයක් තිබුනේද යන්න ඔබගේ මනසට ඇතුලු කරන්න. ඉතා සුවච කීකරු මෙහෙකරුවකු වන ඔබේ මනස ඔබට පිළිතුරු සොයා දෙන ආකාරය ඔබ මවිතයට පත් කරනු ඇත.

### 5. වෙනස අරඹන්න

බොහෝ පුද්ගලයින් තුළ නිර්මාණශීලී නව අදහස් ඇතත් ඔවුන් ඒවා ප්‍රකාශ කිරීමට හෝ ක්‍රියාත්මක කිරීමට මැලි වේ. විවේචනයට ලක්වේයැයි බිය, ප්‍රතික්ෂේප වේයැයි බිය, අවධානයට ලක් වීමේ බිය ආදි බොහෝ කරුණු මීට හේතු විය හැකිය. පිහිනීම ප්‍රගුණ කරන්නට නම් ඔබ දියට බැසිය යුතුමය. නිර්මාණශීලී චින්තනය විකසනය වන්නට නම් එය ඔබ කොහෙන් හෝ පටන් ගත යුතුමය. ඔබ එය ආරම්භ කර යම් තැනකට පැමිණි පසු සෙස්සන් ඔබව අනුගමනය කරනු ඇත.

### 6. අගය කරන්න

ඔබ කුඩා හෝ නිර්මාණශීලී දෙයක් ඉටු කළ විට සෙස්සන් එය අගය කළත් නැතත් ඔබ ඔබවම අගය කිරීමට පුරුදු වන්න. එය ඔබේ මනස කුඩා දරුවකු සේ ආශා කරන බව සිත්හි තබා ගන්න. ඔබ කැමති ආහාරයක් ගැනීම, ඔබ කැමති ගීතයක් ශ්‍රවණය කිරීම හෝ කැමති වැඩසටහනක් නැරඹීම ආදී ලෙස ඔබගේ මනසට ලබා දිය හැකිය.

හොඳින් මතක තබා ගන්න, ලෝකය වෙනස් කරනු ලැබුවේ සාම්ප්‍රදායික මිනිසුන් නොව, නිර්මාණශීලී මිනිසුන්ය. ඔවුන් හා සාමාන්‍ය මිනිසුන් අතර ඇති එකම වෙනස වනුයේ ඔවුන්ට සෙස්සන්ට වඩා දේවල් දෙස වෙනස් ආකාරයකින් බැලීමේ හැකියාවයි. පවත්නා දේවල් වෙනස් ආකාරයකින් සංකලනය කර ඉදිරිපත් කිරීමේ හැකියාව නැතහොත් නිර්මාණශීලී චින්තනය ඔබ තුළ ගැබ්ව පවතී. ඔබ කළ යුත්තේ එය විකසනය කර ගැනීම පමණි.




**ද්විතීයික අධ්‍යාපනය ලබන බහුතර ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ප්‍රමුඛ ඉලක්කය වන්නේ උසස් පෙළ කඩඉම් විභාගයෙන් සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබාගැනීමයි. මෙරට රාජ්‍ය විශ්වවිද්‍යාලවල ඉගැන්වෙන උපාධි පාඨමාලා අතර සිසුන් විශාල ප්‍රමාණයක් බඳවාගන්නා අධික ඉල්ලුමක් ඇති වෘත්තීය පාඨමාලා මෙන්ම අධ්‍යාපනික සුදුසුකම් සපුරාලීම ඉලක්ක කරගත් පාඨමාලා ද වේ.**

**මේ අතර වසරකට ඉතා සීමිත සිසුන් පිරිසක් පමණක් බඳවා ගන්නා, ලෝකයේ ඉතා සුවිශේෂී වෘත්තීය ක්ෂේත්‍රයක් වන නිර්මාණකරුවකු වීම සඳහා අවශ්‍ය අඩිතාලම ඔබට සාදාදෙන සුවිශේෂ පාඨමාලාවක් වන මොරටුව විශ්වවිද්‍යාලයේ සමෝධානික නිර්මාණ අධ්‍යයනාංශය මගින් මෙහෙයවන නිර්මාණවේදී ගෞරව උපාධි පාඨමාලාව සඳහා ඉල්ලුම් කිරීමට පෙර එම පාඨමාලාව පිළිබඳ සංක්ෂිප්ත විවරණයක් ඉදිරිපත් කිරීම මෙම ලිපියේ අරමුණයි.**

### උපාධි පාඨමාලාව :

නිර්මාණවේදී ගෞරව උපාධි පාඨමාලාව (Honors Degree of Bachelor of Design)

### දැක්ම :

දේශීය උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිර්මාණකරණය හා ආශ්‍රිත ධාරාවන් අතර ප්‍රමුඛ පාඨමාලාව වෙමින් විවිධ ක්ෂේත්‍රයන්ට අදාල නිර්මාණවේදී වෘත්තිකයන් දායාද කිරීම.

### ආයතනය :

මොරටුව විශ්වවිද්‍යාලය

### අධ්‍යයනාංශය :

සමෝධානික නිර්මාණ අධ්‍යයනාංශය, වාස්තු විද්‍යා පීඨය

### අධ්‍යයන කාලය :

වසර 4 / වර්ෂාර්ධ 8 (පූර්ණ කාලීන)

### බඳවාගන්නා ප්‍රමාණය :

සිසුන් 50 (2016 වන විට 60 දක්වා වැඩිකිරීමට යෝජිතයි*1)

### බඳවාගැනීම් පටිපාටිය :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත තෝරාගැනීමේ පටිපාටිය සහ මොරටුව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන අභියෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වීම.

දැනට වසර 15කට පමණ පෙර එනම් වසර 2000 දී මොරටුව විශ්වවිද්‍යාලයේ වාස්තු විද්‍යා අධ්‍යයනාංශය යටතේ ඇරඹි නිර්මාණවේදී ගෞරව උපාධි පාඨමාලාව 2012 වසරේ සිට අභිනවයෙන් ස්ථාපනය කළ සමෝධානික නිර්මාණ අධ්‍යයනාංශය (Department of Integrated Design, Faculty of Architecture) යටතේ මෙහෙයවනු ලැබේ. මේ දක්වා කණ්ඩායම් 11කට අයත් 400 කට වැඩි විද්‍යාර්ථීන් පිරිසක් පාඨමාලාව හදාරා ඇති අතර ඔවුහු නිර්මාණකරණයට අදාල වෘත්තීන්වල නියැලෙති.

### පාඨමාලා සංයුතිය:

නිර්මාණවේදී ගෞරව උපාධි පාඨමාලාවේ මූලික වර්ෂාර්ධ 3 (3 Semesters) නිර්මාණකරණයේ මූලිකාංග ඉගැන්වෙන අතර ඉන්පසු නිර්මාණකරණ විශේෂවේදී ක්ෂේත්‍ර සඳහා (Fields of Specialization) සිසුන් යොමුකරනු ලැබේ. පාඨමාලාව විශේෂවේදී ක්ෂේත්‍ර 3 කින් සමන්විතය.

එනම්,

- උපභෝගී භාණ්ඩ නිර්මාණවේදය (Product Design Specialization)
- විලාසිතා නිර්මාණවේදය (Fashion and Lifestyle Design Specialization)
- මාධ්‍ය හා සන්නිවේදන නිර්මාණවේදය (Media and Communication Design Specialization)

### ඉලක්කය :

සාම්ප්‍රදායික රැකියා සඳහා විද්‍යාර්ථීන් ඉලක්කගත නොකිරීම මෙම පාඨමාලාවේ විශේෂත්වය වන අතර ප්‍රමුඛ අභිප්‍රාය වනුයේ නිර්මාණවේදී වෘත්තිකයන් බිහිකර ඔවුන් කලකදී නිර්මාණකරණ ව්‍යවසායකයන් ලෙස තමන්ගේ සන්නාම (Designer Brands) යටතේ දේශීය හා ජාත්‍යන්තර නිර්මාණ වෙළෙඳපොළට පිවිසීමයි. වර්තමානය වන විට නව සන්නාම සමගින් නිර්මාණකරණය ඇරඹීම කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වන්නේ උපභෝගී භාණ්ඩ නිර්මාණවේදය (Product Design Specialization) සහ විලාසිතා නිර්මාණවේදය (Fashion and Lifestyle Design Specialization) හැදෑරූ විද්‍යාර්ථීන්ය. මාධ්‍ය හා සන්නිවේදන නිර්මාණවේදය (Media and Communication Design Specialization) හැදෑරූ විද්‍යාර්ථීන් බහුතරය නිර්මාණ අධ්‍යක්ෂවරුන්, මාධ්‍ය නිර්මාණවේදීන් සහ දෘශ්‍ය නිර්මාණවේදීන් වේ.

### වෘත්තීය ක්ෂේත්‍ර සහ අවස්ථා :

වසර 2004 සිට උපාධි පාඨමාලාව හැදෑරීමෙන් පසු විද්‍යාර්ථීන් ස්ථානගත වී ඇති ක්ෂේත්‍ර සහ ආරම්භක වෘත්තිය ස්ථානගතවීම (Trainee Position) පහත පරිදි වේ. *2





**උපභෝගි භාණ්ඩ නිර්මාණවේදය**
**(Product Design Specialization)**

- නිර්මාණවේදී ව්‍යවසායක (Startup Design Entrepreneur
- පෝසිලේන් /සෙරමික් /වීදුරු කර්මාන්තය
  - නිර්මාණවේදී
- නිර්මාණවේදී ව්‍යවසායක (Startup Design Entrepreneur)
- රූපවාහිනී / ශ්‍රව්‍ය දෘශ්‍ය නිෂ්පාදනය
  - වැඩසටහන් කළමනාකරු / කලා අධ්‍යක්ෂ
- දන්වීම්කරණය / සන්නාම සන්නිවේදනය
  - කලා අධ්‍යක්ෂ / සන්නිවේදන ක්‍රමෝපාය සැලසුම්කරු (Communication Strategist)
- මුද්‍රිත නිෂ්පාදන හා ඇසුරුම්කරණය
  - ග්‍රැෆික් නිර්මාණවේදී (Graphic Designer)
- තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය
  - ග්‍රැෆික් නිර්මාණවේදී (UX/UI Designer)



- ලී / ගෘහභාණ්ඩ / ගොඩනැගිලි අභ්‍යන්තර සැලසුම්
  - නිර්මාණවේදී / නිෂ්පාදන කළමණාකරු
- උපයෝගී භාණ්ඩ කර්මාන්තය
  - නිර්මාණවේදී / සංකල්ප සැලසුම්කරු (System designer / Concept Designer)

**විලාසිතා නිර්මාණවේදය**
**(Fashion and Lifestyle Design Specialization)**

- නිර්මාණවේදී ව්‍යවසායක (Startup Design Entrepreneur)
- විලාසිතා නිර්මාණවේදී (Fashion Designer)
- පෙහෙකම් නිර්මාණවේදී (Textile Designer)
- ආභරණ හා විලාසිතා උපාංග නිර්මාණවේදී (Fashion Accessory Designer)
- විලාසිතා මාධ්‍යකරණය / විලාසිතා සන්නිවේදන උපදේශක (Fashion Writer / Visual Merchandiser)

**මාධ්‍ය හා සන්නිවේදන නිර්මාණවේදය**
**(Media and Communication Design Specialization)**

මෙම රැකියා ක්ෂේත්‍ර තෝරා ගැනීමේදී පාඨමාලාවේ තුන්වන වසර අවසානයේදී අවසන් වසරට පෙර ලබාදෙන සති 14ක කර්මාන්ත හා ක්ෂේත්‍ර පුහුණුව (3 month Industrial Training Module) මගින් විශ්වවිද්‍යාල ජීවිතය හමාර කිරීමට ප්‍රථම නිර්මාණකරණ කර්මාන්තය හා එහි තමාට අභිමත රැකියාව පිළිබඳ පූර්ව දැනුමක් ලබාගැනීමට සිසුන්ට හැකිවේ. කර්මාන්ත හා ක්ෂේත්‍ර පුහුණුව සඳහා සිසුන් යොමුකෙරෙන ආයතන බොහොමයක් ප්‍රමුඛ පෞද්ගලික ආයතන වේ. පුහුණු කාලය තුළදී දක්ෂතා දක්වන සිසුන් කෙරෙහි එම ආයතන වලින් රැකියා ලබාදීමේදී ප්‍රමුඛතාවයක් හිමිවේ.

සමස්ථයක් ලෙස ගත්විට පාඨමාලාව නිමකරන පිරිසෙන් බහුතරය අදාල වසරේ උපාධිප්‍රදානෝත්සවය වන විට රැකියාවල නිරත වේ. 2013 දත්ත අනුව 94.44% ප්‍රතිශතයක් උපාධිප්‍රදානෝත්සවයට පෙර රැකියා වල ස්ථානගත වී තිබේ. මේ පිරිස අතර 8.33% පිරිසක් ආධුනික ව්‍යවසායකයන් ලෙස තම සන්නාම ඇරඹූ අය වෙති. *3

**ප්‍රමිතිය :**

නිර්මාණවේදී ගෞරව උපාධි පාඨමාලාවේ විෂය ඒකක ප්‍රමිතිගතකිරීම් (Benchmarking) සහ බාහිර නිරීක්ෂණයන්ට (External Review) ලක්කෙරෙන අතර ජර්මනියේ University of Art Bremen සහ ඉන්දියාවේ National Institute of Design (NID) මේ සඳහා දායකත්වය දක්වනු ලැබේ. මෙමගින් අපේක්ෂා කරනු ලබන්නේ ජාත්‍යන්තරව ඉතා තරගකාරී ක්ෂේත්‍රයක් වන නිර්මාණකරණ අධ්‍යාපනයේ අද්‍යතන ප්‍රවණතා සමග මෙරට නිර්මාණකරණ අධ්‍යාපනය සැසඳීමයි. එහි ප්‍රතිඵල ලෙස මෙම පාඨමාලාව හදාරා නිමකළ විද්‍යාර්ථීන් සාම්ප්‍රදායික රැකියාවලින් බැහැරව නිර්මාණකරණය හා සම්බන්ධ වෘත්තීන් වල නියැලීම හෝ තම සන්නාමයක් යටතේ නිර්මාණකරණයේ යෙදීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ. එම නිපුණතාව බොහෝ උපාධි පාඨමාලාවන්ගෙන් නොලැබෙන්නකි. **එබැවින් ඔබ නිර්මාණවේදී ගෞරව උපාධි පාඨමාලාව හැදෑරීමට පැමිණිය යුත්තේ සම්ප්‍රදායික රැකියා ඉලක්ක කරගෙන නොව ජාත්‍යන්තරතලයේ නිර්මාණවේදීන් ලෙස වෘත්තීය ජීවිතය ඇරඹීමටයි.**

නිර්මාණවේදී ගෞරව උපාධි පාඨමාලාව පිළිබඳ වැඩිදුර තොරතුරු ලබාගැනීම සඳහා http://design.mrt.ac.lk වෙබ් අඩවියට පිවිසෙන්න. සමෝධානික නිර්මාණ අධ්‍යයනාංශය මෙහෙයවන නිර්මාණ අධ්‍යාපන මාර්ගෝපදේශනය හා නිර්මාණවේදී ගෞරව උපාධි පාඨමාලාව පිළිබඳ දේශනයක් ඔබ පාසලේ සංවිධානය කිරීමට අවශ්‍යනම් 011-2650352 අංකයෙන් අධ්‍යයනාංශය අමතන්න.

**උපුටාගැනීම :**

*1 Annual Implemantation Plan - 2014, University of Moratuwa
*2 External Reviewer's Report - 2014, Dept of Integrated Design
*3 Employment Pattern of Graduates - 2013, University of Moratuwa

**කථිකාචාර්ය ප්‍රභාත් ජයරත්න**
සමෝධානික නිර්මාණ අධ්‍යයනාංශය,
වාස්තු විද්‍යා පීඨය,
මොරටුව විශ්වවිද්‍යාලය.

# මෝස්තර නිරූපණය

**නිර්මාණ ශිල්පියෙකුගේ නිර්මාණයක් අන් අයෙකු විසින් ඉදිරිපත් කිරීම මෝස්තර නිරූපණ ශිල්පයයි. එය රංගනය හා නර්තනය වැනි සාමාන්‍ය ඉදිරිපත් කිරීම් වෙතින් වෙනස් වූ ඉදිරිපත් කිරීමකි. චිත්‍රපටයක හෝ නාට්‍යයක සිදු කරන ඉදිරිපත් කිරීම් මෝස්තර නිරූපණය නොවේ. එසේ වුවද මෝස්තර නිරූපණය හා වෙනත් ඉදිරිපත් කිරීම් අතර වෙනස පැහැදිළිව හඳුනා ගැනීම අසීරුය.**



මෝස්තර නිරූපණ ශිල්පය යටතේ ක්ෂේත්‍ර ගණනාවක් හඳුනාගත හැකි අතර ඔවුන්ගේ නිරූපණ පොත්, සඟරා, පුවත්පත්, රූපවාහිනි නාට්‍ය වැඩසටහන්, සංගීතමය රූපරාමු ආදී විවිධ මාධ්‍යයන් තුළින් නිරූපණය වේ. මෝස්තර නිරූපණයෙහි සිත් ගන්නා සුලු අලංකාරයත්, මූල්‍යමය වශයෙන් ඇති වාසිදායකබවත් මෙම ක්ෂේත්‍රය කරා බොහෝ දෙනා නැඹුරු වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපායි.

වර්තමානයේ ඉතාමත් තරඟකාරී ක්ෂේත්‍රයක් බවට පත්ව ඇති මෙම ක්ෂේත්‍රයෙහි ඉතිහාසය හා වර්ධනය දෙස බැලීමේදී එය යුග තුනක් යටතේ සාකච්ඡාවට බඳුන් කළ හැක.

1. 1960
2. 1970-1980
3. 1990 සිට වර්තමානය

නිරූපණ ක්ෂේත්‍රයේ පියා ලෙස සැළකෙන්නේ Charles Fredrick Worth (1853) ය. ඡායාරූපකරණයේ වර්ධනයත් සමඟ නිරූපණ ක්ෂේත්‍රය සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන්නට විය.

වර්ෂ 1960 ගණන් වල නිරූපණ ක්ෂේත්‍රය අරභයා නියෝජිත ආයතනවල ආරම්භය සිදු විය. යුරෝපය තුළ මෙම නියෝජිත ආයතන සීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. නිරූපණ ශිල්පීන් සඳහා ප්‍රධාන වශයෙන් වෙළෙඳ පොළ සකස් වූයේ ලන්ඩන් නුවරය.

1970 දශකය නිරූපණ ක්ෂේත්‍රයේ වැදගත් සන්ධිස්ථානයක් බවට පත් විය. මේ සමයේදී නිරූපණ ශිල්පය ව්‍යාපාරයක් වශයෙන් වර්ධනය වූවා පමණක් නොව ලෝකය තුළ ප්‍රධාන නිරූපණ නියෝජිත ආයතනයන්හි ආරම්භයද සිදු විය. වර්ෂ 1980 වන විට නිරූපණ ශිල්පීන් හට සිය වෘත්තිය පූර්ණ කාලීන වෘත්තියක් ලෙස පවත්වා ගෙන යා හැකි වාතාවරණයක් ගොඩ නැගී තිබුණි. මෝස්තර නිරූපණ ශිල්පයේ ක්‍රමික වර්ධනයත් සමඟ එය පුළුල් ක්ෂේත්‍ර ගණනාවක් තුළ ව්‍යාප්ත විය.

- High fashion
- Editorial print
- Commercial print
- Catalogue modeling
- Plus size modeling
- Glamour modeling
- Body parts modeling
- TV commercials

**මෙවැනි ක්ෂේත්‍රවලට අමතරව මෝස්තර නිරූපණය තුළ හඳුනාගත හැකි තවත් ක්ෂේත්‍ර ඇත.**

## High Fashion

මෙම ක්ෂේත්‍රයට යොමු වීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් ගණනාවක් වේ. මන්ද මෝස්තර නිරූපණ ශිල්පය තුළ හඳුනා ගත හැකි ඉහළම පියවර මෙය වන බැවිනි. නිරූපණ ශිල්පිණියකට මේ සඳහා සාමාන්‍යයෙන් උස 172 cm -180cm (5'8-5'11)



තිබිය යුතු අතර ශරීරයේ ප්‍රමාණය 4-6 (US) හෝ 6-8 (UK) මෙන්ම වයස් ප්‍රමාණය 14- 25 විය යුතුය.

නිරූපණ ශිල්පියෙකු වීම සඳහා 180 cm -188 cm ( 5ʹ11- 6ʹ2) උසකින් යුතු වීම මෙන්ම පපුවේ ප්‍රමාණය 94 cm- 106 cm (37- 42), ඉන 76 cm-81 cm (30-32) යුතු දේහධාරී පුද්ගලයෙකු වීම අවශ්‍යය. වයස අවුරුදු 16 සිට 40 දක්වා මෙම කාණ්ඩය යටතේ නිරූපණය කළහැක.

නිරූපණ ශිල්පියෙක් තම ශරීරය නියමිත ආකාරයට පවත්වාගෙන යන්නේ නම් මෙම වෘත්තිය හරහා දීර්ඝ ගමනක් යාමට අවස්ථාව ඇත.

## Editorial Print

ඉහතින් සඳහන් කළ High fashion වලදී සාකච්ඡා කළ කරුණු මෙහිදීද නිරූපණ ශිල්පීන් හා ශිල්පිනියන් වීම කෙරෙහි බලපායි. සඟරා කවර නිර්මාණය කිරීම ආදිය මෙහිදී සිදුවන අතර ඡායාකාන්ත (photogenic) වීම අවශ්‍යයය. මෙවැනි නිරූපණ ශිල්පීන් විශාල දායකත්වයක් ක්ෂේත්‍රය තුළ සැපයුවද සාපේක්ෂව ඔවුන්ගේ ඉපයීම අඩු වේ. නිරූපණ ක්ෂේත්‍රයට යොමු වීම සඳහා මෙම අංශය විශාල රුකුලක් වන අතර වසර කිහිපයකින් ලද අත්දැකීමත් සමඟ තම වෘත්තීමය ජීවිතය සාර්ථක කර ගැනීමට හැකිය.

## Commercial Print

විවිධ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා සුපිරි වෙළඳසැල් සහ වෙළෙඳ ප්‍රචාරක පුවරුවල පෙනී සිටීම මෙහිදී සිදු වේ. High fashion සඳහා යොමු වීමට අවස්ථාව නොලැබෙන අයට මේ සඳහා ඉදිරිපත් විය හැක.

## Catalouge Modeling

තම භාණ්ඩ හා වස්ත්‍ර ආදිය විකිණීමේදී ඒවා පාරිභෝගිකයන් අතර ප්‍රචලිත කිරීම සඳහා විවිධ ආයතන Catalouge නිර්මාණය කරනු ලබයි. මෙහිදී විවිධ විලාසිතා අංගවලට විවිධ අවස්ථා සොයා ගත හැකි අතර මූල්‍යමය වාසි ලබා ගැනීමේ අවස්ථාද සාපේක්ෂව ඉහළය.

වර්තමානයේදී බොහෝ ආයතන තම භාණ්ඩ හා සේවා පිළිබඳ ප්‍රචාරක වැඩසටහන් Online කිරීමට නැඹුරු වන අතර එහිදී නිරූපණ ශිල්පීන්ට විශාල අවස්ථා ප්‍රමාණයක් උත්පාදනය වේ.

## Plus Size Modeling

මින් අදහස් වන්නේ විශාල ප්‍රමාණයේ ශරීරයකට හිමිකම් කියන පුද්ගලයන් නිරූපණයට යොමු වීමයි. මෙම නිරූපණ අංශය වර්තමානයේදී ඉහළ යමින් පවතින අතර තමන්ටම ආවේණික විශේෂතා ඇත්නම් මේ සඳහා පහසුවෙන් යොමු විය හැක.

## Body Parts Modeling

යම් නිෂ්පාදනයක්/ නිර්මාණයක් එළි දැක්වීමට ශරීරයේ එක් අංගයක් පමණක් උපයෝගී කර ගැනීම මෙහිදී සිදු වේ. මෙහිදී බහුල වශයෙන් යොදා ගැනෙන්නේ හිසකෙස්, ඇස්, තොල්, දෙපා,දෙපතුල් ආදියයි. සමස්ත රූපයේ ආකර්ශනීය බව මෙහිදී කිසිසේත් වැදගත් නොවේ.

## TV Commercials

මෙහිදී සිදු වන්නේ රූපවාහිනී වෙළෙඳ දැන්වීම් සඳහා පෙනී සිටීමයි. මෙම අංශයේදී උස, බර,වයස ආදී කාරණා බල නොපාන අතර රංගනයට ඇති හැකියාව යම්තාක් දුරකට වැදගත් වේ. මෙය සහජ හැකියාවක් හෝ පුහුණු කරන ලද හැකියාවක් විය හැකියි. රූපවාහිනී වෙළෙඳ දැන්වීම් සඳහා පෙනී සිටීම තුළින් නිරූපණ ශිල්පියෙක් හෝ ශිල්පිනියක් ලෙස දීර්ඝ ගමනක් යාම සඳහා මාවත සකසා ගත හැකිය.

ඉහතින් සඳහන් කළ එක් එක් අංශයන් සඳහා අවශ්‍ය වන්නාවූ විශේෂිත කරුණු හැරුණුකොට මෝස්තර නිරූපණ ක්ෂේත්‍රයට පිවිසීමට බලාපොරොත්තු වන්නන් සැලකිලිමත් විය යුතු කරුණු බොහොමයකි. ප්‍රථමයෙන් ඔබට මෙම ක්ෂේත්‍රය කෙරෙහි ඇල්මක්, කැමැත්තක් තිබිය යුතුය.

### තමන් පිළිබඳව සැලකිලිමත් වීම

- යහපත් ශරීර සෞඛ්‍යය අත්‍යවශ්‍ය කරුණකි. බාහිර පෙනුම පිළිබඳව සැලකිලිමත් විය යුතුය. සෑම විටම කදිම ඇඳුම් පැළඳුම් තෝරා ගැනීමට අවධානය යොමු කළ යුතුය.
- දිදුලන, නිරෝගී කෙස් කළඹ අත්‍යවශ්‍ය කරුණකි.
- සිරුර නිරෝගීව හා නියමිත හැඩයෙන් පවත්වා ගෙන යාම අවශ්‍යයය.

### දැනුම ලබා ගැනීම

අනෙකුත් ක්ෂේත්‍රවලදී මෙන්ම මෝස්තර නිරූපණ ක්ෂේත්‍රයේදීද නිරූපණ ශිල්පීන් තම වෘත්තිය පිළිබඳ අධ්‍යාපනය ලබා ගත යුතුය.



ක්ෂේත්‍රය පිළිබඳ ඇති පොත්පත්, සඟරා, අත්පොත් ආදිය කියවීම මගින් දැනුම ලබා ගත හැකි වනවා සේම තම කුසලතා වර්ධනය කර ගැනීම සඳහාද කියවීම ඉවහල් වේ.

නිරූපණ ක්ෂේත්‍රය සුරූපී මුහුණු වලින් සම්පූර්ණයෙන්ම පිරුණු ක්ෂේත්‍රයකි. එනමුත් සුරූපී මුහුණක් තිබූ පමණින් නිරූපණ ශිල්පියෙක් ලෙස සාර්ථකත්වය ළඟා කර ගත නොහැක. සහජ කුසලතා, ආකල්ප මෙන්ම තමන්ට ආවේණික ලක්ෂණ හඳුනා ගනිමින් ඒ තුළින් තමන්ට සුදුසු අංශය කුමක්ද යන්න හඳුනා ගත යුතුය. ඒ සඳහා තමා ලබා ගන්නා දැනුම ඉවහල් වේ. Sri Lanka Foundation Institute ( Certificate In Fashion Modeling), Gaza Monologues Modeling And Acting School Of Sri Lanka, Zsaid Images වැනි ආයතන මගින් ශ්‍රී ලංකාව තුළදී මේ සම්බන්ධ දැනුම ලබා ගැනීමට අවස්ථාව ඇත. එමෙන්ම විදේශ රටකදී මෝස්තර නිරූපණය සම්බන්ධ අධ්‍යාපනය ලැබීමට කැමති ඔබට ඒ සඳහා විශාල අවස්ථා ගණනාවක් විවිධ ආයතන මගින් උදා කර ගත හැක.

තවද මෝස්තර නිරූපණ ශිල්පියෙකු සෑම විටම වෘත්තීමය ආකාරයෙන් හැසිරිය යුතු අතර සුහදශීලී වීම විවිධ අවස්ථාවන් ලැබීමට උපකාරී වේ. එමෙන්ම

- නියමිත වේලාවට තම සේවාවන් සඳහා පෙනී සිටීම
- නිවැරදි ලෙස සංවිධානය වීම
- ඡායාරූප ශිල්පීන් සමඟ මනා සම්බන්ධතාවක් ගොඩනගා ගැනීම
- නිරූපණ ශිල්පය වෘත්තියක් ලෙස සැළකීම
- විවේචන නිසා සිත් තැවුල් ඇතිකර නොගැනීම
- යම් හෙයකින් ප්‍රතික්ෂේප වුවහොත් ඉන් නොනැවතී යළිත් උත්සහ කිරීම
- ගිවිසුම් අත්සන් කිරීමේදී ප්‍රවේශම් වීම
- තමන්ගේ සීමාවන් දැන නිරූපණ කටයුතු සඳහා සහභාගී වීම
- නිරූපණ තරග සඳහා සහභාගී වීම
- මත්ද්‍රව්‍යවලින් වැළකී සිටීම

ආදී ගුණාංග නිරූපණ ශිල්පියෙක් තුළ අත්‍යවශයෙන්ම තිබිය යුතු ගුණාංග වේ. එමෙන්ම ඡායාරූප ගැනීමේදී නිර්මාණශීලී විය යුතුය. අනුග්‍රාහකයෙකු ලැබීම මෙවන් ශිල්පියෙක් හට අමතර වාසියක් වනවා සේම මෝස්තර නිරූපණ ශිල්පියෙකු ලෙස තම දක්ෂතා ඔප් නැංවීම සඳහා ඒ සඳහා වූ පාඨමාලාවක් හැදෑරිය හැකිය. තම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් දැනුවත් වීම ඒ සඳහා කරන්නා වූ ආයෝජනයකි.

මෝස්තර නිරූපණ ක්ෂේත්‍රයට යොමු වීමට බලාපොරොත්තු වන ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ට ඒ සඳහා අවශ්‍ය දැනුම ලබා ගැනීමට ඒ සම්බන්ධයෙන් වූ පාඨමාලා හැදෑරීම මගින් පහසුවෙන් අවස්ථාව උදා කර ගත හැකිය. මෙම ක්ෂේත්‍රයේ පරිණත බවට පැමිණි අයෙක් මෙන්ම නිරූපණ වින්‍යාස ක්‍රමවේද හසුරුවන්නෙක් වන රොසෑන් ඩයස් මහත්මියගේ Zsaid ආයතනය මේ සඳහා කදිම තෝතැන්නක් වනවා නිසැකයි. පහතින් දැක්වෙන්නේ ඇය සමඟ කළ සාකච්ඡාවක් ඇසුරින් ගත් වැදගත් කරුණු කිහිපයකි.

**මුලින්ම මෝස්තර නිරූපණ ක්ෂේත්‍රය පිළිබඳ හැඳින්වීමක් කළොත්......**

නිර්මාණ ශිල්පියාගේ නිර්මාණය ඉදිරිපත් කිරීම මෝස්තර නිරූපණ ශිල්පයයි. එය ඕනෑම ක්ෂේත්‍රයක නිර්මාණයක් විය හැකියි. යම්කිසි වෙළෙඳ භාණ්ඩයක්, ඇඳුම්, ආභරණ, චිත්‍රයක්, ආහාර වර්ග වැනි ඕනෑම දෙයක් විය හැකියි. මෙම නිර්මාණය නිරූපණය කරන පුද්ගලයා නිරූපණ ශිල්පියා/ශිල්පිනිය වේ.

**මෝස්තර නිරූපණ ශිල්පියෙකුට රූපය වැදගත් වන්නේ කොයි ආකාරයෙන්ද?**

මෙහිදී වැදගත් වන්නේ රූපය නොව නිරූපණ ශිල්පියා තුළින් නිර්මාණය කොතරම් දුරට එළි දැක්වෙනවාද යන කාරණයයි. ඒ නිසා එහිදී එම ශිල්පියාගේ පෞරුෂත්වය අත්‍යවශ්‍ය සාධකයක් වේ.

**ඉහතින් සඳහන් කරන ලද අංශයන්ට අමතරව මෝස්තර නිරූපන ශිල්පය යටතේ ශ්‍රී ලංකාව තුළ හඳුනාගත හැකි වෙනත් අංශ මොනවාද?**

වෙනත් අංශ ලෙස Bridal Modeling" Contest Modeling වැනි අංශ හඳුනාගත හැකියි.

## Bridal Modeling

මනාලියන් ලෙස හැඩ ගැන්වීම මෙහිදී සිදු වේ. මෙහිදී රූපයට වැදගත් තැනක් හිමි වන අතර අංග චලන කෙරෙහි වැඩි අවධානය යොමු වේ.එම ගුණාංග ඇති ඕනෑම අයෙකුට මෙම අංශය තුළින් නිරූපන ක්ෂේත්‍රයට පිවිසිය හැකි අතර මූලික දැනුම ලබා තිබීම ප්‍රමාණවත්ය.

## Contest Modeling

මෙම අංශයේදී තමන්ව වඩාත් ඉස්මතු වන අතර මෙහිදී පෞරුෂත්වය,රූපය, ස්ථානෝචිත ප්‍රඥාව,ආත්ම විශ්වාසය, සන්නිවේදන හැකියාව වැනි ගුණාංගයන් අවශ්‍ය වේ.උදාහරණ ලෙස Miss Sri Lanka, Miss World, Miss Universe වැනි තරග හඳුන්වා දිය හැක. මෙවැනි තරග සඳහා ඉදිරිපත් විය යුත්තේ හුදෙක් අත්දැකීම් ලබා ගැනීම සඳහා නොව ජයග්‍රහණය වෙනුවෙනි.

**මේ ක්ෂේත්‍රයට පිවිසීමට බලාපොරොත්තු වන්නන් තුළ තිබිය යුතු ගුණාංග මොනවාද?**

මේ ක්ෂේත්‍රය පිළිබඳ ආශාවක්, කැමැත්තක් මෙන්ම දක්ෂතාවද තිබිය යුතුය.Style එක නොහොත් කලා ක්‍රමය එක් එක් පුද්ගලයාට ආවේනික වූවකි. තමා තුළින් එය හඳුනාගත යුතුය. නිරූපන වින්‍යාසය හසුරුවන්නෙකුට කළ හැක්කේ ක්‍රමවේදය ඉගැන්වීම පමණය. එය ග්‍රහණය කර ගෙන තමන්ට ආවේනික ලෙස නිරූපන ඉදිරිපත් කිරීමට හැකියාව තිබිය යුතුය.

**මෝස්තර නිරූපන ක්ෂේත්‍රය සම්බන්ධ යම් පනත් පනවා තිබේද?**

28 පිටුවට >>

සාකච්ඡා කොට සකස් කළේ
එෆ්. ෆ්ලෝරීඩා
මානව සම්පත් සංවර්ධන නිළධාරී
මිනිස්බල හා රැකීරක්‍ෂා
දෙපාර්තමේන්තුව



හසර

# ගෘහ නිර්මාණ ශිල්පියෙකු වීමට සිහින දකින ඔබටයි





සමාජයේ වෙනස්වීමත් සමග කුටුම්භයට කොටු වූ කාන්තාවන්ගේ භූමිකාව බෙහෙවින් වෙනස් වන්නට විය. මෙම වෙනස්වීමත් සමග පිරිමියා තරමටම ඥානවන්ත හැකියාවන්ගෙන් පරිපූර්ණ කාන්තාවන්ට සමාජයේ ඉහළ ස්ථරයන්ට පැමිණීමට හැකිවිය. සීමාව ඉහළ අවකාශය වේ. (Sky is the limit for you) යන කියමන සනාථ කරමින් මෙලෙස වෘත්තීය ක්ෂේත්‍රයේ ඉහළටම පිවිස සමාජ ආර්ථික සංවර්ධනයට දායක වන කාන්තාවන් බොහෝ පිරිසක් සිටී. වරලත් වාස්තු විද්‍යාඥවරියක් වන තුෂාරි කොත්තිගොඩ එලෙස වෘත්තීමය ලෙස ඉහළින් සිටින කාන්තාවකි.

පාසල් කාලයේ දී ඉගෙනීමට පමණක් නොව චිත්‍ර විෂයට, කලාවට, සෞන්දර්යයට, විලාසිතාවන්ට මහත් දක්ෂතාවයක් දක්වූ ඇය මහනුවර උසස් බාලිකා විද්‍යාලයෙන් උසස් පෙළ සඳහා ජීව විද්‍යාව හැදෑරුවාය. මොරටුව විශ්ව විද්‍යාලය සඳහා ප්‍රවේශය වූ ඇය නිර්මිත පරිසරය (Built Environment) පිළිබඳ විද්‍යාවේදී උපාධියද, වාස්තු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධියද (M.Sc) හදාරා පසුව ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයයින්ගේ ආයතනයේ වරලත් වාස්තු විද්‍යා පාඨමාලාවත්, බ්‍රිතාන්‍ය වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනයේ වරලත් වාස්තු විද්‍යා පාඨමාලාවත් හදාරා වාස්තු විද්‍යාඥවරියක් ලෙස සුදුසුකම් ලැබුවාය. ඊට අමතරව අධ්‍යාපන මාවතේ තවත් ඉදිරියට යමින්, බ්‍රිතාන්‍යයෙන් අභ්‍යන්තර අලංකරණය පිළිබඳ ඩිප්ලෝමාවද හැදෑරූ ඇය එක්සත් රාජධානියේ හා මැද පෙරදිග රටවල වරලත් වාස්තු විද්‍යාඥවරියක් ලෙස සේවය කළාය.

සිය දැනුම හා අත්දැකීම් පදනම් කරගනිමින් තුෂාරි කොත්තිගොඩ වර්තමානයේ සිය සහකරු වූ වරලත් වාස්තු විද්‍යාඥ තිලාන් කොත්තිගොඩ සමඟ KWA Architects නමින් සමාගමක් පටන් ගත්තාය. මෙම සමාගම අද ශ්‍රී ලංකාවේ වාස්තු විද්‍යාව හා අභ්‍යන්තර අලංකරණය පිළිබඳ උපදේශන සේවාවන් ලබාදෙමින් මහා පරිමාණ ඉදිකිරීම් වලට දායක වෙමන් සිටී. ගෘහ නිර්මාණය, අභ්‍යන්තර අලංකරණය පිළිබඳ තමාගේ ආයතනයක් පිහිටුවා ගැනීමට අමතරව ඇය මොරටුව විශ්ව විද්‍යාලයේ සහ කොළඹ වාස්තු විද්‍යා පාසලේ වාස්තු විද්‍යාව හා අභ්‍යන්තර අලංකරණය පිළිබඳ බාහිර කථිකාචාර්යවරියක ලෙස සේවය කරයි.

වාස්තු විද්‍යාව සිය ජීවන වෘත්තිය කරගත් ඇයගේ අදහස් ...

**පරිසරයේ අපූර්ව වූ හැඩතලයන් නිර්මාණය වාස්තු විද්‍යාව ද ?**

මෙම ගොඩනැගිලි ඉදිකිරීමේ කලාව නැතිනම් වාස්තු විද්‍යාව යනු මිනිසා විසින් අපූර්ව ලෙස පරිසරය නිර්මාණය කිරීමයි. ඒ අනුව වාස්තු විද්‍යාඥයා යනු මිනිසාගේ සිතුම් පැතුම් යථාර්තයක් බවට පත්කළ හැකි නිර්මාණශීලී පුද්ගලයෙකි. මිනිසාගේ සිතුම් පැතුම්, ජීවන විලාශයන්, සංස්කෘතීන් ආදී සැඟවුනු කතාවන් අතීතයේ සිට වර්තමානය හරහා අනාගතයට පරම්පරාවෙන් පරම්පරාවට රැගෙන යන්නේ වාස්තු විද්‍යාව තුළිනි. එනිසා වාස්තු විද්‍යාව/ ගෘහ නිර්මාණ ශිල්පය යනු අතීතය වර්තමානය අනාගතය තුළ අඛණ්ඩ සන්නිවේදනයක යෙදෙන සජීවි විෂයයකි.

**වාස්තු විද්‍යාඥයෙක් අඳින සෑම ඉරකටම යම් තේරුමක් තියෙනවා කියා කියමනක් තියෙනවා ඒ ඇයි ?**

වාස්තු විද්‍යාඥයා යනු වෘත්තිකයෙකි. සරල ලෙස පෙනුණද මෙය ඉතා සංකීර්ණ වූ ක්‍රියාවලියකි. මිනිසුන්ගේ අවශ්‍යතා සිතුම් පැතුම් එලෙසින්ම ප්‍රතිනිර්මාණය කිරීමේ හැකියාව සේම පරිසරයේ අවකාශය තුළ හැඩතලයන් නිර්මාණය කිරිමේ හැකියාවද වාස්තු විද්‍යාඥයෙතු සතුවිය යුතුය. කලාව, සෞන්දර්යය පරිකල්පනාත්මක අදහස් සේම විද්‍යාව තාක්ෂණය හා බැඳි විද්‍යාත්මක, තර්කානුකූල, විශ්ලේෂණාත්මක හැකියාවත් වාස්තු විද්‍යාඥයෙකුට අත්‍යාවශ්‍ය ය. සාමාන්‍යය මිනිසෙකු යම් භූමියක දකින්නේ හිස් අවකාශයක් වුවද වාස්තු විද්‍යාඥයෙකුගේ මනස තුළ තම සේවා ලාභියාගේ සිතුම් පැතුම් අනුව ගොඩනැංවෙන නිවස ත්‍රිමාණාකාරව ප්‍රතිනිර්මාණය වේ. මේ මනසේ ප්‍රතිනිර්මාණය වන අදහසට අනුවයි අදාල ගොඩනැගිල්ලේ සැලැස්ම සකස් වන්නේ . එනිසායි වාස්තු විද්‍යාඥයෙක් අඳින සෑම ඉරකටම යම් තේරුමක් තියෙනවා යැයි කියන්නේ. ඔහු වසර ගණනාවක් තුළ ලබාගත් ගැඹුරු, ක්‍රමානුකූල අධ්‍යයනයන් ගෙන් මෙන්ම වෘත්තීය, අධ්‍යාපනික දැනුම,පුහුණු අත්දැකීම් සේවා ලාභියාගේ සිතුම් පැතුම් යථාර්තයක් කිරීමට යොදා ගනී . තව පුද්ගලයෙතු සකස් කරන නිවසක ජීවිත කාලයම සුව පහසුවෙන් ගත කරන්නේ කෙසේද යන්න ඇතැම් විට ඔබට ප්‍රශ්නයක් වනු ඇත . නමුත්

සැබැවින්ම වාස්තු විද්‍යාඥයෙකු සේවා ලාභියාගේ සිතුම් පැතුම් පමණක් නොව සේවාලාභියාගේ ජීවන විලාශය, වෘත්තීය භූමිකාව පිළිබඳවත් අවධානය යොමු කරයි. උදාහරණයක් ලෙස ඔහු නිවස නිර්මාණය කරන්නේ කලා කරුවෙකුට නම් එය ඔහුගේ සිතුම්පැතුම්වලට පමණක් නොව එය ඔහුගේ වෘත්තීය භූමිකාවටත් ගැළපිය යුතුයි. මෙනිසායි වාස්තු විද්‍යාඥයෙකු ක්ෂේත්‍රය පිළිබඳව මෙන්ම සමාජය පිළිබඳවත් ගැඹුරු අවබෝධයකින් යුතු පුද්ගලයෙකු විය යුතු වන්නේ.

**ඉහත හැකියාවන් සේම සමාජය සමඟ ගනුදෙනු කිරීමේ හැකියාව වාස්තු විද්‍යාඥයෙකුට අවශ්‍ය ද?**

වාස්තු විද්‍යාව යනු සාමාජීය විද්‍යාවකි. වාස්තු විද්‍යාඥයෙකුට ලොකු, කුඩා සෑම පරාසයකම සිය සේවාලාභීන් සමඟ පමණක් නොව ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඉංජිනේරුවන්, ප්‍රමාණ සමීක්ෂකයින්, සැලසුම්කරුවන් වැනි වෘත්තිකයින් සමඟත් මේසන්, වඩු වැනි කාර්මිකයින් සමඟත්, කොන්ත්‍රාත්කරුවන් සමඟත්, ඉතා සමීපව කටයුතු කිරීමට සිදු වේ. එනිසා වාස්තු විද්‍යාඥයෙකු ලෙස කටයුතු කිරීමේදී නිර්මාණශීලී, පරිකල්පන හැකියාව පමණක් නොව ඉහතින් සඳහන් කළ සෑම පරාසයකම පුද්ගලයින් සමඟ ගනුදෙනු කිරීමේ හැකියාවද තිබිය යුතුයි. ඔවුන් සමඟ සාකච්ඡා කිරීමේ, තීරණ ගැනීමේ හැකියාව සේම ඔවුන්ව මෙහෙයවීමේ හැකියාවත් අත්‍යාවශ්‍ය වේ .

**වාස්තු විද්‍යා ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ට සාර්ථකත්වයට පත්වීමට හැකි ද?**

ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව වෘත්තිකයෙක් ලෙස මෙම ක්ෂේත්‍රයට එකතුවන සෑම පුද්ගයෙකුටම ඉහත සඳහන් කළ හැකියාවන් හා පෞරුෂ ගුණාංග තිබීම අත්‍යවශ්‍ය වන අතර එවැනි පුද්ගලයෙකුට ක්ෂේත්‍රයේ වෘත්තිකයෙක් ලෙස ඉහල ස්ථානයකට ප්‍රවේශ විය හැකියි.

වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තමාගේම ව්‍යාපාරයන් ආරම්භ කොට ක්ෂේත්‍රයේ ඉතා ඉහළ මට්ටමක සිටින කාන්තා චරිත වර්තමානයේ සිටී. එනිසා කාන්තාවක් වුවත් ඔබට ඉහත සඳහන් පෞරුෂ ලක්ෂණ සතු නම් ඔබේ වෘත්තීය සංවර්ධන ගමනට එය බාධාවක් වන්නේ නැත.

**වාස්තු විද්‍යා ක්ෂේත්‍රයේ දේශීයව, ජාත්‍යන්තරව වෘත්තීය ඉල්ලුමක් තිබේද ?**

ලෝකය විද්‍යාත්මක හා තාක්ෂණිකව වේගයෙන් දියුණු වෙමින් පවතී. එසේම මෙම සංකීර්ණ තත්ත්වයන් මත මිනිස් අවශ්‍යතාවයන්ද ජීවන තත්ත්වයන්ද ඊට සාපේක්ෂව නිරන්තරව වෙනස් වෙමින් පවතී. අද නිවාස තැනීම සරල නිවාසයේ සිට නිවාස සංකීර්ණ දක්වා පරිවර්තනය වී තිබේ. නිවෙස් පමණක් නොව අහස උසට ගොඩනැගෙන සංකීර්ණ ගොඩනැගිලි හෝටල්, කාර්යාල අද සුලබ දර්ශනයක්. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වර්ධනයත් සමඟ වර්තමානයේ ගෘහ නිර්මාණ ක්ෂේත්‍රයේ ද ඇති වී තිබෙන්නේ විශාල පිබිදීමක්. මෙය දේශීයව හා විදේශීයව දක්නට ලැබෙන තත්ත්වයකි. එනිසා වාස්තුවිද්‍යා වෘත්තිකයින්ට රාජ්‍ය, පෞද්ගලික අංශයේ පමණක් නොව විදේශීය වශයෙන්ද විශාල පරාසයක රැකියා අවස්ථා අද නිර්මාණය වී තිබේ. අවශ්‍ය නම් තමා ගේම සමාගමක් ආරම්භ කොට කටයුතු කිරීමේ අවස්ථාවන් ඕනෑතරම් තිබේ . එනිසා අවශ්‍ය වෘත්තීමය සුදුසුකම් ලබා ගන්නේ නම් රැකියා අවස්ථා ඕනෑ තරම් පවතින ක්ෂේත්‍රයක් ලෙස හඳුන්වා දිය හැකියි. පරිකල්පනාත්මක, නිර්මාණශීලී විද්‍යාත්මක චින්තනය ඔබ සතුනම් ශ්‍රී ලංකාවේ පමණක් නොව මුළු ලෝකයේම නමක් දිනාගත හැකි ගෘහනිර්මාණ ශිල්පියෙකුවීමේ හැකියාව ඔබට ඇත. ඊට හොඳම උදාහරණය වන්නේ ශ්‍රී ලංකාවෙන් ලෝකයට ගිය ජෙෆ්රි බාවා ගෘහ නිර්මාණ සම්ප්‍රදායයි. ශ්‍රී ලංකාවට ආවේණික වාස්තු විද්‍යාත්මක සම්ප්‍රදායක් නිර්මාණය කරමින් එය ලෝකයට ගෙන යාමට ශ්‍රී ලාංකික ගෘහනිර්මාණ ශිල්පී ජෙෆ්රි බාවාට හැකිවිය. පරිසරයත් සමඟ බද්ධව ඔහු බිහිකල සම්ප්‍රදාය කණ්ඩලම හෝටලය, පාර්ලමේන්තු ගොඩනැගිල්ල ආදී නිර්මාණයන් තුළින් දැකගත හැකියි. මේවන විට ලෝකයේ විවිධ රටවල ගෘහනිර්මාණ ශිල්පී පාඨමාලාවන්හි විෂය මාලාවට ජෙෆ්රිබාවා ගෘහ නිර්මාණ ශෛලිය ඇතුලත් කොට ඇති අතර වාස්තු විද්‍යා ක්ෂේත්‍රය තම වෘත්තීය ක්ෂේත්‍රය ලෙස තෝරා ගැනීමට අපේක්ෂිත තරුණ තරුණියන්ට මෙය හොඳ ආදර්ශයකි .

**මෙම ක්ෂේත්‍රයේ ඇති විවිධ අංශ මොනවාද?**

අද විවිධ ඉසව් ඔස්සේ මෙම ක්ෂේත්‍රය ව්‍යාප්ත වෙමින් පවතී. ගෘහ අභ්‍යන්තර වාස්තු විද්‍යාඥයින්, භූමි අලංකරණ වාස්තු විද්‍යාඥයින්, නගර සැළසුම් කරුවන් ඒ අතර වේ .





භූමි නිර්මාණවේදී වාස්තු විද්‍යාඥයින් ස්වාභාවික පරිසරය ගොඩනැගී ඇති පරිසරය හා ඉතා සංවේදී වෙමින් මිනිසුන්ගේ විනෝදය සඳහා පරිසරය සෞන්දර්යාත්මකව සකසයි. භූමිය පිළිබඳ විශ්ලේෂණය කිරීම, සැළසුම, කළමනාකරණය, ආරක්ෂණය, තුළින් පරිසරය නිර්මාණශීලීව සකස් කරයි. ගෙවතු අලංකරණයේ සිට විශාල මල්වතු උද්භිද උද්‍යාන සැකසීම භූමි නිර්මාණවේදීන්ගේ වෘත්තීය භූමිකාවට අයත්වේ.

ගෘහ අභ්‍යන්තර වාස්තු විද්‍යාඥයින් සිය සේවාලාභින්ගේ අවශ්‍යතාවයන් හා උවමනාවන් අනුව ආලෝකය වර්ණ, අවකාශයේ ස්වභාවය සැලකිල්ලට ගනිමින් පෞද්ගලික නිවාස, වාණිජ ගොඩනැගිලි, හෝටල්වල ඇතුලත හා පිටත අවකාශයන් ආරක්ෂාව, කාර්යක්ෂමතාව සුරකෙන පරිදි සෞන්දර්යාත්මකව නිර්මාණය කරයි. නිවසක හෝ සංකීර්ණ ගොඩනැගිල්ලක වර්ණ ගැන්වීම, ගෘහ භාණ්ඩකරණය තිරරෙදි ආලෝකකරණය වැනි අභ්‍යන්තර අලංකරණයන් සියල්ල සිදුවන්නේ ගෘහ අභ්‍යන්තර අලංකරණ ශිල්පීන් මගිනි.

**වෘත්තිමය වාස්තු විද්‍යාඥයෙක් වන්නේ කෙසේ ද ?**

ශ්‍රී ලංකාවේ මේ සඳහා මාර්ග දෙකක් තිබේ. එකක් වන්නේ මේ ක්ෂේත්‍රයෙන් සරසවි අධ්‍යාපනය ලබා ගැනීමයි. දෙවැන්න නම් කොළඹ වාස්තු විද්‍යා පාසල මගින් අවශ්‍ය වෘත්තිමය සුදුසුකම් ලබා ගැනීමයි.

**සරසවි අධ්‍යාපනය ලබාගැනීම**

මොරටු විශ්ව විද්‍යාලය මගින් වාස්තු විද්‍යාව පිළිබඳ උපාධි පාඨමාලාව සඳහා අ.පො.ස උසස්පෙළ විභාගයෙන් ඉහළම අගයක් , ලබාගැනීමට අමතරව මොරටුව විශ්ව විද්‍යාලය මගින් පවත්වනු ලබන තෝරාගැනීමේ විභාගයෙන් ද සමත්වීම අත්‍යවශ්‍ය වේ. මෙම උපාධි පාඨමාලාව සඳහා වසර 5 ක් ගතවන අතර ඉන්පසු B.ARCH යන ගෞරව උපාධිය හිමිවේ. මෙම උපාධිය සඳහා ජාත්‍යන්තරව ඉහළ පිළිගැනීමක් පවතින අතර මෙය ජාත්‍යන්තරව පිළිගත් RIBA (Royal Institute of British Architects) හි පළමු හා දෙවන අදියර සම්පූර්ණ කිරීමට සමානය. වාස්තු විද්‍යාව ආශ්‍රිතව උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසු ශ්‍රී ලංකා වාස්තු විද්‍යා සංගමය මගින් සංවිධානය කරනු ලබන වාස්තු විද්‍යාව පිළිබඳ වරලත් පාඨමාලාව (Chartered Architecture) හැදෑරිය හැකියි. මෙය RIBA හි තෙවන පියවර හා සමාන වේ.

**සරසවි වරම් අහිමි නම්**

සරසවි වරම් නොලැබූ සිසුන්ටද වෘත්තියය වාස්තුවිද්‍යාඥයෙකුවීමේ අවස්ථාව පවතී. ඒ කොළඹ වාස්තු විද්‍යා පාසල (Colombo School of Architecture) මගින් පවත්වනු ලබන පාඨමාලා හැදෑරීමෙනි. මෙම පාඨමාලාව අදියර 3 කින් සමන්විතයි. SLIA -Part 111 කොටස හැදෑරීම සඳහා වරලත් වාස්තු විද්‍යාඥයෙකු යටතේ වසර 2 ක පූර්ණ කාලීන පළපුරුද්දක් ලබා තිබිය යුතුය. මින් සුදුසුකම් ලබා ගන්නා අයදුම්කරුවන් වරලත් වාස්තු විද්‍යාඥයෙකු බවට පත්වන අතර ඉන්පසු ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලැබේ AIA (SL) ශ්‍රී ලංකාවේ වාස්තු විද්‍යාඥයෙකු ලෙස සේවය කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා වාස්තු විද්‍යාඥයින් ලියාපදිංචි කිරීමේ මණ්ඩලයේ (ARB-Architects Registration Board) ලියාපදිංචි විය යුතු අතර ඔබ බ්‍රිතාන්‍ය හෝ වෙනත් රටක වාස්තු විද්‍යාඥයෙකුවීමට අපේක්ෂා කරන්නේ නම් අදාල රටේ වෘත්තීමය පාඨමාලාව හැදෑරිය යුතු වේ. RIBA( Royal Institute of British Architects) සුදුසුකම් ලබා ගැනීමෙන් පොදුරාජ්‍ය මණ්ඩලයේ රටවල්වල වාස්තු විද්‍යාඥයෙකු ලෙස සේවය කිරීමේ අවකාශය ලැබේ. බ්‍රිතාන්‍යයේ රාජකීය වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනයේ විභාගවලට ඇතුලත්වීමේ සුදුසුකම් ලෙස SLIA -Part 1 හා SLIA -Part 11 පාඨමාලා පිළිගනී. (SLIA -Part 1 හා SLIA -Part 11 සමත් නම් RIBA පළමු හා දෙවන කොටස්වලින් නිදහස් වේ.)

මෙම අධ්‍යාපනික හා වෘත්තීය මාවතේ යාමෙන් වෘත්තීමය වාස්තු විද්‍යාඥයෙකුවීමේ අවස්ථාව ඔබට ඇත.



**තුෂාරි අනුරුද්ධිකා**
වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී
මිනිස් බල හා රැකීරක්ෂා
දෙපාර්තමේන්තුව

රුව ඇති දුවක් හා කට ඇති පුතෙක් ලැබීම මවකට සම්පතක් බව අතීතයේ සිට පැවති පිළිගැනීමයි. මේ දෙක පමණක් නොව ප්‍රඥාවෙන් ද අගතැන්පත් දියණියක් ලැබීම මවකට මොනතරම් ආඩම්බරයක් ද ? එපමණකින් නොනැවතී මුළු ලොවේම කීර්තිය පතුරමින් ලක් මවගේ හිස පලන් මලක් මෙන් රටට අන්තර් ජාතික මට්ටමේ දිනුමක් ලබා දෙමින් රටේ උත්තරීතර ආයතනය වූ පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට තරම් වාසනාවක් ලද රටේ ප්‍රබල චරිතයක්ව සිටින ඒ දියණිය ඒ මවට මෙන්ම අප රටට ද ආඩම්බරයකි.

මෙවන් වූ විරල වාසනා ගුණයක් දෝතින් ගෙන උපන් ඈ වත්මන් ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය භාර ගරු අමාත්‍ය රෝසි සේනානායක මැතිණියයි.





# විකසිත මලක්

සාම්ප්‍රදායික කාන්තාවකගේ භූමිකාව සාර්ථකව ඉටු කරනා අතරම රටේ ප්‍රතිපත්ති සම්පාදනයට ද දායක වෙමින් රටේ දරු පරපුරේ වගකීම් සමුදායම සියතට ගත් එතුමිය කලක් මැලේසියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් ධූරයෙන් ද පිදුම් ලැබීය. ළමා කටයුතු මෙන්ම කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් ප්‍රබල හඬක් නැගූ දේශපාලන චරිතයක් ලෙස රෝසි සේනානායක මැතිණිය අප මතකයට එන්නේ ශක්තිමත් පෞරුෂයක් හිමි කාන්තාවක ලෙසටය. 1980 වසරේ ලක් රූ රැජින ලෙස කිරුළු පැලඳි එතුමිය 1985 වසරේ ලෝක විවාහක රූ රැජින ලෙස අන්තර්ජාතික සම්මානයට පාත්‍ර විය. කලා ලෝකයේ විවිධ නිර්මාණවලට දායක වෙමින් ජනහද දිනාගත් රෝසි සේනානායක මැතිණිය වර්තමානයේ වෘත්තීය දේශපාලනඥවරියක් ලෙස රාජ්‍යපාලනයට ද හවුල් වී ඇත.

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවත්නා රටක කාන්තාව සතුව ඇත්තේ ඉතා වගකිව යුතු භූමිකාවකි. අනාගත දරු පරපුර රටේ සංවර්ධනය සඳහා සූදානම් කරවීමේ වගකීමෙන් වැඩි කොටසක් පැවරී ඇත්තේ කාන්තාවටයි. එසේම වර්තමානය වන විට ශ්‍රම බලකාය තුළ කාන්තාවන්ගේ දායකත්වයද වැඩි වෙමින් පවතී.

මේ නිසාම ඉහළ ආත්ම ශක්තියකින් හෙබි, උගත්, කුසලතා පරිපූර්ණ කාන්තාවක් ලෙස රෝසි සේනානායක මැතිණිය අපට ලබා දෙන්නේ ඉතා වටිනා ආදර්ශකි. ජීවිතයේ අභියෝගවලට සාර්ථකව මුහුණ දෙමින් නොසැලී ඉදිරියට ආ ඇය ලබා ගත් දෙස් විදෙස් අත්දැකීම් රාශිය හසර පාඨක තරුණ දූ පුතුන් වෙනුවෙන් බෙදා ගැනීමට අප හා එක් වූයේ මෙසේය.

**ළමා කටයුතු භාර රාජ්‍ය ඇමතිතුමිය ලෙස අනාගත වැඩ ලෝකය සඳහා දරුවන් සූදානම් කිරීමේ දී ගුරු දෙමාපිය වගකීම ලෙස ඔබ දකින්නේ කුමක් ද ?**

දරුවන්ගේ ජීවන කුසලතා හඳුනා ගැනීම ඉතාම වැදගත්. කුඩාකල සිටම ඔවුන්ගේ ජීවන කුසලතා, සහජ දක්ෂතා ගුරු දෙමාපියන් විසින් හඳුනා ගත යුතුයි. ඒවා හඳුනාගත් පසු ඒ ඒ දරුවාට ආවේණික ආකාරයෙන් ඒවා වැඩි දියුණු කර ගැනීමට අවශ්‍ය පරිසරය ඔවුන්ට නිර්මාණය කර දිය යුතුයි. අද බොහෝ දක්ෂතා ඇති දරුවන් සිටිනවා. ක්‍රීඩාව, කලාව, ඉගෙනීම, නර්තනය ආදී අංශවලින් ඉදිරියට යාමට දරුවන්ට අද බොහෝ මාර්ග තිබෙනවා. මේ නිසා ඒ සඳහා හොඳ පරිසරයක් දරුවන්ට ඇති කළ යුතුයි. නිවසේදීත්, පාසලේදීත්, නිදහස් මනසකින් කටයුතු කිරීමට වටපිටාව සකසා දිය යුතුයි. දරුවන්ගේ ආකල්ප වෙනස් විය යුතුයි. දරුවන්ට හොඳින් ඇහුම්කන් දිය යුතුයි. එසේම ඔවුන් පීඩාවට පත්වන අයුරින් කටයුතු නොකිරීමට දෙමව්පියන්ගේත් ගුරුවරුන්ගේත් වගකීමයි. එක් එක් දරුවන්ගේ සහජ දක්ෂතා අනුව ඔවුන්ගේ හැකියාවන් වෙනස් වන නිසා සැමටම අවස්ථාව දියයුතුය. එකම මිම්මෙන් පමණක් දරුවන් මැනීමෙන් මේ වෙනස් බව හඳුනාගත නොහැකියි. මේ නිසාම ඔවුන්ගේ දක්ෂතා වර්ධනය වන පරිසරයක් පාසලේ නිර්මාණය කළ යුතුය.

අද බොහෝ දෙමාපියන් දරුවන් පීඩාවට පත් කරනවා ඔවුන්ව මානසිකව හා කායිකව පීඩාවට පත්කරන විට නිර්මාණශීලී බව

මතු වෙන්නෙ නෑ. ඔවුන්ගේ නියම හැකියාවන් ඉස්මතු වෙන්නේ නෑ. දරුවන්ට නිදහසේ හැදෙන්නට දිය යුතුයි. ඒ වගේම ඔවුන් කුඩා කාලයේ සමාජය ගැන අත්දැකීමෙන් ඉගෙන ගන්නවා. මට මතකයි මා කුඩා කාලයේ ලද අත් දැකීම්. ගමක ජීවත්වන විට අත්දැකීම් රාශියක් ලබා ගන්න පුළුවන්. ගහකට නගින කොට ළමයා අවකාශය හඳුනාගන්නවා. ආත්ම විශ්වාසය දියුණු කර ගන්නවා. ඒ ඇතිවන අත්දැකීම් මත තමා අනාගතයේ දී ඊට වඩා විශාල කාර්යයන් කිරීමට අවශ්‍ය කායික හා මානසික පසුබිම සකස් වන්නේ. මේ නිසා මේ දේවල නිරත වීමට දරුවාට ඉඩ සලසා දිය යුතුයි. ඔවුන්ගේ ආරක්ෂාව සලසා දිය යුතුයි. නිසි පෝෂණය දිය යුතුයි. මානව සංවර්ධනයේ ප්‍රධානතම සාධකයක් තමයි සෞඛ්‍ය සම්පන්න භාවය. නිරෝගීමත් මානව සම්පතක් ගොඩනැගීමට නම්, ජීවන චක්‍රයේ සෑම අවධියකම සිදුවන පෝෂණය ඉතාම වැදගත් වෙනවා. විශේෂයෙන්ම පෞරුෂය වර්ධනය කෙරෙහි බලපාන ප්‍රධාන සාධකයන් අතරින් ගර්භනී සමයේ සිටම දරුවෙකු වෙනුවෙන් ලබාදෙන පෝෂණය ඉතාම වැදගත්. දරුවෙකු පිළිසිඳගත් දිනයේ පටන් දරුවා බිහිකළ පසුවත්, ක්‍රමයෙන් වර්ධනය වන සමයේදීත් ලබාදෙන පෝෂණය, තාරුණ්‍යයේ එළිපත්තෙහි සිටින ඕනෑම දරුවෙකුට ඉතාම වැදගත් වෙනවා. මොළයේ නිසි වර්ධනයට හා ශාරීරික වර්ධනයන් නිසි පරිදි පවත්වාගෙන යාමට පෝෂණය අතිශය වැදගත් වන නිසා මෙන්ම අපි රජයක් විදිහට ළමා කටයුතු අමාත්‍යාංශය ලෙසත් ගර්භනී මාතාවන්ට රු. 2000/- ක මාසික පෝෂණ දීමනාවක් ලබා දීමට කටයුතු කර තිබෙනවා. එහි අරමුණ

> **අද බොහෝ දෙමාපියන් දරුවන් පීඩාවට පත් කරනවා ඔවුන්ව මානසිකව හා කායිකව පීඩාවට පත්කරන විට නිර්මාණශීලී බව මතු වෙන්නෙ නෑ. ඔවුන්ගේ නියම හැකියාවන් ඉස්මතු වෙන්නේ නෑ. දරුවන්ට නිදහසේ හැදෙන්නට දිය යුතුයි. ඒ වගේම ඔවුන් කුඩා කාලයේ සමාජය ගැන අත්දැකීමෙන් ඉගෙන ගන්නවා.**

තමයි අනාගත දරු පරම්පරාව නිසි පෝෂණයෙන් යුතුව නිර්මාණය කිරීම.

මේ රටට උචිත දරු පරපුරක් බිහි කිරීමට දෙමාපියන් සතු විශාල වගකීමක් පවතිනවා. මේ නිසා දරුවන් පිළිබඳව ඉතා වගකීමෙන් කටයුතු කළ යුතුයි. ගුරුවරුන්ටත් විශාල වගකීමක් තිබෙනවා.

අධ්‍යාපනය මෙන්ම දරුවාට හොඳ පෞරුෂයක් සකස්කර ගැනීමට සහය වීම වෙනුවෙන්. ඒ සඳහා දරුවන්ගේ සහජ දක්ෂතා දියුණු වන නායකත්වය ආදී හැකියාවන් දියුණුවන හොඳ පරිසරයක් පාසලේ ඇති කළ යුතුයි.



**තරුණ දූ දරුවන් මේ පිළිබඳ කටයුතු කළ යුත්තේ කොහොම ද ?**

සම්ප්‍රදායික රැකියා ගැන පමණක් සිතන රාමුවෙන් ඈත්වෙන්න ඕන. ලෝකයේ බොහෝ රටවල මේ තත්ත්වය වෙනස්වෙලා. අපේ රටේ ද මේ සිතන ක්‍රමය වෙනස් විය යුතුයි. මට වඩා සුදුසු රැකියාව කුමක් ද කියා ගැඹුරින් සිතිය යුතුයි. එය තමාගේ සහජ දක්ෂතා තව දුරටත් වර්ධනය කරගත් අවස්ථාවක් විය යුතුයි. විශේෂයෙන්ම උසස් අධ්‍යාපනය හදාරන්නන්ට තම දැනුම වගේම වෘත්තිය පිළිබඳව ද සිතා එය තෝරා ගත යුතුයි. අද තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය පරිසරය දරුවාට තිබෙනවා. මේ නිසා ලෝකය පිළිබඳව ගවේශනාත්මකව සෑමවිටම ජීවිත ඉලක්ක පිහිටුවාගෙන ඒ අනුව කටයුතු කිරීම වැදගත්. අද අතීතය වගේ නෙවෙයි. ඉහළ මට්ටමේ රැකියාවන් බවට පත් වූ නව රැකියා අවස්ථා රාශියක් තිබෙනවා. ලෝකයේ තිබෙන රැකියා ඉල්ලුමට සරිලන ආකාරයට තමන් හැඩ ගැසිය යුතුය.

**අධ්‍යාපන සුදුසුකම් තිබියදීත් විරැකියාවෙන් පෙලෙන තරුණ දරුවන් සිටිනවා. මේ ගැන ඔබට දිය හැකි උපදෙස් මොනවාද ?**

කුමන හෝ උපාධියක් තිබූ පමණින් රැකියාවට සුදුසු වන්නේ නෑ. වෘත්තීය ආචාරධර්ම පිළිබඳව සැලකිය යුතුයි. හොඳ අධ්‍යාපනයක් තිබුනත් සම්මුඛ පරීක්ෂණවලදී අසාර්ථකත්වයට පත්වන්නේ අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව රැකියාවට අවශ්‍ය අනිකුත් ගුණාංග සපුරාගෙන නැති නිසයි. තම ඇඳුම් පැළඳුම් පවා රැකියාවට අනුගත ලෙස හැඩ ගැසිය යුතුයි. විශේෂයෙන්ම සන්නිවේදන කුසලතා, සාමුහිකව වැඩ කිරීම, විශ්ලේෂණ කුසලතාවය, නායකත්වය ආදී මෘදු කුසලතා වැඩිදියුණු කර ගත යුතුයි. පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා මෙන්ම තමා විසින්ම නිර්මාණශීලි ලෙස නව රැකියා අවස්ථා උත්පාදනය කර ගැනීමට තරුණයින් උත්සාහ ගත යුතුයි.

**මේ පිළිබඳව අන්තර්ජාතික වශයෙන් ඔබට බොහෝ අත්දැකීම් ඇති.**

සාමාන්‍යයෙන් බහුජාතික සමාගම්වලට විධායක මට්ටමේ නිලධාරියෙකු බඳවා ගැනීමේදී මනෝවිද්‍යානුකූල ප්‍රවේශයක් ඔවුන් අනුගමනය කරනවා.

26 පිටුවට >>



සාකච්ඡා කොට සකස් කළේ
**එරන්දතී රන්දෙනිය**
වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරී
මිනිස්බල හා
රැකීරක්ෂා දෙපාර්තමේන්තුව



# නව නිපැයුම් කළමනාකරණය

නව නිපැයුම් කළමනාකරණය යනු නව නිපැයුම් ක්‍රියාවලිය කළමනාකරණය කිරීමයි. එයට සංවිධාන නව්‍යකරණය හා නිෂ්පාදන නව්‍යකරණය අදාල වේ. මෙය කළමනාකරුවන්ට හා ඉංජිනේරුවන්ට තම ආයතනයේ ඉලක්ක හා ක්‍රියාවලි පිළිබඳව සාමාන්‍ය අවබෝධය ලබා ගැනීමේ මෙවලමක් ලෙස භාවිතා කළ හැකිය. සංවිධානයක අභ්‍යන්තර හා බාහිර අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා නව නිපැයුම් කළමනාකරණය යොදාගත හැකි අතර නිර්මාණශලීභාවය, නව අදහස් හඳුන්වා දීම, නිෂ්පාදන ක්‍රියාවලිය ආදිය සඳහා යොදා ගත හැකිය. සෑම මට්ටමකම සේවකයින්ගේ නිර්මාණශීලීභාවය වර්ධනය කිරීම, නිෂ්පාදන සංවර්ධනය, නිෂ්පාදනය හා අලෙවි කිරීම ආදී අදියරයන් සඳහා මෙය දායක වේ.

නව නිපැයුම් කළමනාකරණය සඳහා යොදා ගන්නා සාමාන්‍ය උපකරණ අතර බුද්ධිකලම්භනය, Virtual, Prototyping, අදහස් කළමණාකරණය, TRIZ-assisted Stage-Gate Process වැනි ආකෘති ගත හැකිය. නව නිපැයුම් කළමනාකරණයේ පුරෝගාමියා වන්නේ ඕස්ට්‍රියානු ජාතික ආර්ථිකවිද්‍යාඥයකු වූ ජෝෂප් ෂුම්පිටර් ය. ආර්ථික වර්ධනය, සඳහා හඳුනා ගත හැකි සාධකයක් ලෙස නව්‍යකරණය ඔහු හඳුනා ගත්තේය.

නිර්මාණශීලිභාවය ඕනෑම රටකට අත්‍යවශ්‍ය සාධකයකි. එසේවුවත් වර්තමානයේ අප රට තුළ මේ සඳහා දක්වා ඇත්තේ ඉතා අල්ප වූ දායකත්වයකි. ලෝකයේ දියුණු සංවර්ධිත රටවල් මේ සඳහා ඉතාමත් ඉහළ ප්‍රතිචාරයක් දක්වා ඇති නිසාවෙන් එම රටවල් නව නිපැයුම් අතින් අප රටට වඩා සෑහෙන දියුණු මට්ටමක පවතින බව පෙනී යයි. උදාහරණ ලෙස චීනය නව නිපැයුම් නිපදවීම තුළින් ඉදිරියටම ගිය රාජ්‍යයකි. ඉතාමත්ම නිර්මාණශීලි භාණ්ඩ නිපදවන චීනය එම ස්ථානයට ළඟාවීමට බලපෑ මූලික හේතුව නිර්මාණශීලී සෙල්ලම් බඩු කර්මාන්තයයි.

නව නිපැයුම් කිරීම නිසා ඊට එහා ගිය නිර්මාණශීලී මෙවලම් පසු කලෙක ඔවුන් අතින් නිර්මාණය විය. මිනිසුන්ගේ පරිකල්පන හැකියාව හා චින්තන ශක්තිය මේ සෙල්ලම් බඩු නිපදවීම තුළින් වර්ධනය වී ඇති වා මෙන්ම වැඩිහිටියන්ට අවශ්‍ය භාණ්ඩ නිපදවීමට ද එය මනා පිටිවහලක් විය. අද වන විට නිර්මාණශීලි නිපැයුම්



**තිලාන් ජයතිලක**

**MBA** in IT
University of Moratuwa
**BSC** in Engineering
Univesity of Peradeniya
**PGD** in Managment
**CCVP, ACP, ITIL-V, CLA**

තුළින් ජාත්‍යන්තර වශයෙන් කීර්ති නාම දිනා ගැනීමට චීනය සමත් වී ඇත.

නව නිපැයුම් ආකාර දෙකකි.

1. නිෂ්පාදන නව නිපැයුම්
2. ක්‍රියාවලි නව නිපැයුම්

**1. නිෂ්පාදන නව නිපැයුම්**

මින් අදහස් වන්නේ කුමන හෝ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීමයි. මෙය අලුත්ම එකක් හෝ තිබෙන නිෂ්පාදනයක් තවත් සංවර්ධනය කිරීමක් විය හැකිය.

**2. ක්‍රියාවලි නව නිපැයුම්**

එනම් නිෂ්පාදනය සඳහා අවශ්‍ය ක්‍රියාවලියයි. උදාහරණ ලෙස 5S, ශ්‍රම

නිර්මාණශීලීභාවය දරුවාට ඇතිවීමට නම් වම් මොළය හා දකුණු මොළය අතර සම්බන්ධතාවය ඇති විය යුතුය. එය ක්‍රියාකාරී ලෙස දරුවාට දිය යුතුය. මේ සඳහා සෞන්දර්යය, ක්‍රීඩා, ප්‍රබන්ධ කථා නිර්මාණ, චිත්‍ර ශිල්පය, ඡායාරූපකරණය, වැනි ක්‍රියාකාරකම් වඩාත් ගැළපේ. විශේෂයෙන්ම මෙම ප්‍රබන්ධ කථා මගින් නිර්මාණය වූ නිශ්පාදන පසුකාලීනව සැබෑ ලෙස නිර්මාණය වීම පිළබඳ අත්දැකීම් බොහෝ ඇත. ආතර් සී ක්ලාක් මහතා ලියූ විද්‍යා ප්‍රබන්ධ බොහොමයක් අඩංගු නිර්මාණ සැබෑ වී ඇති බව අපි දනිමු.

ලියානාඩෝ ඩාවින්චිගේ මුල්ම ගුවන්යානා චිත්‍රයද එසේ සැබෑ

අතර එහි වැඩකරන්නේ පැය 4ක් පමණි.

ඉතිරි කාලය තමාට රිසි අයුරින් ගත කිරීමට සේවකයාට පහසුකම් සලසා ඇත. යුරෝපා රටවලද මෙවැනි දේ දක්නට ලැබෙන අතර සේවකයාට ඇති මෙම නිදහස ඔවුන් නිර්මාණශීලී කාර්යයන් කෙරෙහි යොමු වීමට තදින් බලපායි.

ආයතනයක යම් කිසි නිර්මාණයක් කළ පසු එය එළි දැක්වීම ද ඉතා වැදගත් කාර්යයකි. එසේ කිරීමේදී මේ දෙය කළ යුත්තේ මොන කාලයේ ද, කුමන වේලාවේ ද, රටේ පවතින ඉල්ලුම, දේශගුණය, කාලගුණය අනුව ගැළපේ ද යන්න සැලකිය යුතුය. එසේ නොවුනහොත් කොපමණ






විභජනය වැනි. මෙහිදී වෘත්තිකයන්ට මෙම දෙආකාරයෙන්ම සිතීමට හැකිවිය යුතුය.

**අපේ රටේ අධ්‍යාපන ක්‍රමයෙන් මෙම නිර්මාණශීලි බව වර්ධනය කිරීමේ ක්‍රමවේද දරුවන්ට දීම අත්‍යවශ්‍ය වේ. න්‍යායයන් හැදෑරීම පමණක් දරුවන්ට කිසිසේත් ප්‍රමාණවත් වන්නේ නැත. පහළ අධ්‍යාපනයේ මේ නිර්මාණශීලී භාවයන් ඇතිකිරීමේ ක්‍රම ඇතුලත්ව ඇතත් සෑම දරුවෙක්ම ඒ සඳහා යෙදවේදැයි දෙමාපියන් මෙන්ම ගුරුවරුන් ද සැලකිලිමත් විය යුතුය.**

නිර්මාණශීලිබව යනු එක්තරා ආකාරයක කුසලතාවයකි. එය මුදලට ගත හැකි හැකියාවන් නොවේ.

වූ සිහිනයකි. එවැනි සිහින දකින්නන්ගේ සිහින යථාර්තයක් බවට පත්කිරීමට ඔවුන්ට නොහැකි වුවත් ඉංජිනේරුවන් වැනි වෙනත් ශිල්පීන්ට එය නව අදහසක් ලෙස උකහා ගැනීමට පහසුවකි. මේ නිසාම විෂයධාරාවට අමතරව ක්‍රියාකාරකම් ලෙස සැලකෙන මෙවැනි දෑ කෙරේ දරුවන් යොමු වීම පිළිබඳව සෘනාත්මකව නොසිතිය යුතුය. ආයතනයක වැඩ පරිසරය තුළදී මෙම නිර්මාණශීලී භාවය ඔප් නැංවීම අත්‍යවශ්‍ය කාරණයකි. විශේෂයෙන්ම එම ආයතනය සංවර්ධනය වන්නේ එවිටය. මේ සඳහා හොඳම උදාහරණය google.com ආයතනයයි. එය සම්ප්‍රදායික කාර්යාලයක් නොවන

හොඳ' නිර්මාණයක් සිදුකලද ඉන් නියම ප්‍රයෝජන ලබා ගැනීමට කිසිවකු ඉදිරිපත් නොවේ. එසේම එහි ඇති නියම ගුණාත්මක භාවයද අනෙකාට නොවැටහේ. මේ නිසා නිර්මාණයක් බිහිකිරීම පමණක් නොව ඉන්පසු එම ක්‍රියාවලිය අවසන් නොවන බවද නිර්මාපකයා දැනගත යුතුය.

යම්කිසි නිර්මාණයක් නිමකිරීමේ දී එහි ආරම්භක පිරිවැය ඉතා අධිකය. මේ නිසාම නිර්මාණ ද මිළ අධික දෙයකි. එසේම එය නියම මට්ටමට ගුණාත්මකභාවයට පැමිණ නැත. මේ නිසා මෙම නිර්මාණය මුලදී මිළදී ගන්නාට ඉන් කිසි ප්‍රයෝජනයක් ගත නොහැකිවිය හැකිය. යමක් මුලටම ගන්නා කෙනා මුලටම දිනන්නේ ද

නැති විය හැකිය. මේ නිසා ඉල්ලුම අඩු වී ලාභ අලාභ අඩුවිය හැකිය. මේ නිසා තත්ත්වය පාලනය කළ යුතු දෙයකි. මෙම නිර්මාණය පසු කාලීනව වඩාත් දියුණු වී එය ඉතාම ප්‍රයෝජනවත් එමෙන්ම අඩු පිරිවැයකින් නිපදවීමට හැකිවිය හැකිය. ඒ සඳහා උදාහරණ ඕනෑතරම් සොයාගත හැකිය.

නිර්මාණයක් වෙළෙඳපොළට කලට වේලාවට ඉදිරිපත් කිරීමේ දී සිතිය යුතු වැදගත්ම කරුණ නම් එහි නිර්මාණ අයිතිය රැකගත යුත්තේ කෙසේද යන්නයි. අද සමාජයේ නිර්මාණ මංකොල්ලය ඉතා තදින් සිදුවන බැවින් මේ පිළිබඳව වඩාත්ම සිතිය යුතුය. එසේ නොවුනහොත් නිෂ්පාදකයා මෙන්ම නිර්මාණකරුවාද අධෛර්යයට පත්වන අතර නිර්මාණයේ ප්‍රයෝජනය ගන්නේ වෙනත් අයයි. මේ සඳහා Copy Right බලපත්‍රය, බුද්ධිමය දේපල පනත, වැනි ක්‍රම මගින් නීතිමය රැකවරණය ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.

තමන් යම් කිසි නිර්මාණයක් කිරීමේ දී එම සමස්ථ නිර්මාණයට අයිති සියළු දේ තමන් නිර්මාණය කලයුතු යැයි නීතියක් නැත. එසේ කිරීමද අපහසුය. පුද්ගලයකු හෝ ආයතනයක් ලෙස සෑම දේකටම දක්ෂවන්නේ නැත. එහෙත් තමන්ට නොහැකි එහෙත් නිර්මාණයකට අදාල යම් කොටසක් ඇත්නම් එය බාහිර පාර්ශවයක් මගින් සිදු කර ගැනීමේ වරදක් නැත. මෙය බාහිරකරණය ලෙස හැඳින්විය හැකිය.

එසේම බද්ද ව්‍යාපාර, අත්පත් කර ගැනීම් ලෙසින් ද මෙය කළ හැකිය. මෙහිදී වෘත්තිකයකු ලෙස තමන්ට නොකළ හැකි දේ නොකර සිටීම වැදගත් ආචාර ධර්මයක් වන අතර එසේ නොකළ හැකි දෑ අන් අයකු ලවා කරවා ගැනීම වෘත්තීය සදාචාරය රැකීමකි.

යම්කිසි නිර්මාණයක් වෙළෙඳපොළට දැමීමේදී ඒ සඳහා මූල්‍යමය වටිනාකමක් තිබිය යුතුය. නිර්මාණයක තිබෙන වැදගත්ම දෙය නම් එහි මූල්‍ය වටිනාකමට වඩා වැඩි වටිනාකමක් නිපැයුමට තිබීමයි. නිර්මාණශීලීත්වය මුදල් දී ලබාගත නොහැකි දෙයක් මෙන්ම එම නිර්මාණයේ අද්විතීයභාවයක් ද ඇත. මේ නිසා එම නිර්මාණය සඳහා මූල්‍ය වටිනාකම තීරණය වීමට බලපාන සාධකය නිෂ්පාදන පිරිවැය පමණක් නොවේ. මේ නිසා ඊට එකතුවන වටිනාකම ඉහළය. එසේම පාරිභෝගිකයා එය මිළදී ගන්නේ ද එහි ඇති මූල්‍ය වටිනාකමට වඩා නිර්මාණශීලි වටිනාකම පිළිබඳ වැඩි වටිනාකමක් තමාට ඇති හෙයිනි.

ලොව ගොඩ නැගෙන්නේ නිර්මාණශීලී මිනිසුන් අතිනි. නිර්මාණශීලීභාවය තුළ වගකීම් මෙන්ම අවදානම් දැරීමේ ශක්තිය ද ඇත. එසේ දරා ගැනීමේ හැකියාව ඇති මිනිසුන් ගොඩ නගන නව නිපැයුම් අත්හදා බලන්නේ ද එවැනි අයයි. ලෝකය ඉදිරියට යන්නේ මේ තුළිනි. මෙලොව ලස්සන වන්නේ ද මේ තුළිනි. නිර්මාණශීලී බව යනු දියුණු වීමේ මාවතයි. සාර්ථක වූ සෑම මිනිසෙක්ම නවතාවයකින් ලොව දෙස බැලූ අයවලුන්ය. මේ නිසාම දරුවන්ට නිර්මාණශීලී වීමට අවශ්‍ය කුසලතාව ලබා දීම හා ඊට පසුබිම සැකසීම අත්‍යවශ්‍යය. නූතන තරුණ පරපුරේ වගකීම වන්නේ ද තම සහජ හැකියාවන් අකාලයේ මිලින වීමට නොදී නවතාවයකින් යුතුව ජීවිතය ජය ගැනීමට හැකි මංපෙත් එමගින් විවර කර ගැනීමයි.



නිර්මාණශීලීභාවය තුළ වගකීම් මෙන්ම අවදානම් දැරීමේ ශක්තිය ද ඇත. එසේ දරා ගැනීමේ හැකියාව ඇති මිනිසුන් ගොඩ නගන නව නිපැයුම් අත්හදා බලන්නේ ද එවැනි අයයි. ලෝකය ඉදිරියට යන්නේ මේ තුළිනි. මෙලොව ලස්සන වන්නේ ද මේ තුළිනි. නිර්මාණශීලී බව යනු දියුණු වීමේ මාවතයි.



# සංචාරක මාර්ගෝපදේශනය
# Tour Guiding

සංචාරක ගමනාන්ත ලෙස කටයුතු කරන ලෝකයේ ලොකු කුඩා සෑම රටකම පාහේ සංචාරක මාර්ගෝපදේශකයන් විසින් සංචාරකයන්ට සහ එරට සංචාරක ව්‍යාපාරයට මහගු සේවයක් ඉටු කරනු ලැබේ. බොහෝ රටවල සංචාරකයන් අදාල සංචාරක ගමනාන්තයට ළගා වූ අවස්ථාවේ දී හමුවන ප්‍රධානතම පුද්ගලයාවනුයේ සංචාරක මාර්ගෝප දේශක වරයෙකි. එසේම සංචාරකයා අදාල සංචාරක ගමනාන්තයේ ගත කරන මුළු කාලය තුළදී කථා කිරීමට, ආශ්‍රය කිරීමට හා සම්බන්ධතා පැවැත්වීමට ලැබෙන එකම පුද්ගලයා විය හැක්කේ ද මාර්ගෝපදේශකවරයෙකි. සංචාරක ගමනාන්තයකදී හමුවන එම සංචාරක මාර්ගෝපදේශකවරයා කථාකරන ආකාරය, හැසිරෙන ආකාරය හා සංචාරකයන්ට සලකනු ලබන ආකාරය පිළිබඳව සංචාරකයන් විමසිලිමත්වන අතරම, එමගින් එම සංචාරක ගමනාන්තයේ වෙසෙන ජනතාව පිළිබඳවද විනිශ්චයකට එළඹීමට සංචාරකයෝ පෙළඹෙති. සංචාරක මාර්ගෝප දේශකවරයා සමග චාරිකාවේ යෙදෙන කාලය තුළදී එම සංචාරක මාර්ගෝපදේශකවරයා තුළින් පිළිබිඹු කෙරෙන සියළු ගුණාගුණ පොදුවේ එම රට හා එම රටේ ජනතාව පිළිබඳව තක්සේරුවකට මිණුම් දණ්ඩක් වශයෙන් යොදා ගැනීමට සංචාරකයා පෙළඹීම වැළැක්විය නොහැක. එම නිසා සංචාරක මාර්ගෝපදේශකවරයකුගේ කාර්යභාරයට නිල නොලත් තානාපතිවරයෙකුගේ කාර්ය භාරයට සමාන විය යුතු බව අමුතුවෙන් සඳහන් කළ යුතු නොවේ.

සංචාරයක් සඳහා පළමුවතාවට නුහුරු නුපුරුදු ආගන්තුක සංචාරක ගමනාන්තයකට පියනගන සංචාරකයකු එම රටට ගොඩ බසින්නේ කුතුහලය මුසු සුන්දර සිහිනයක් මනසෙහි රඳවාගෙනය. සංචාරකයාගේ එම සුන්දර සිහිනය සැබෑකර ගැනීමට සහය වීම සංචාරක මාර්ගෝප දේශකවරයකුගේ වගකීමක් ද වේ.

තම සුන්දර සිහිනය සැබෑකර ගැනීමට අවස්ථාව සැලැසුනු සංචාරකයකු නිරන්තරයෙන් නැවත එම රටට ආපසු පැමිණීමේ ප්‍රවනතාවයක්ද පවතී.

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවලට සංචාරකයන් ආකර්ෂණයකර ගැනීම සඳහා ප්‍රබල



ප්‍රචාරක මාධ්‍යයක් වශයෙන් සංචාරක මාර්ගෝපදේශකවරයකු විසින් ඉටුකරනු ලබන සේවය යොදා ගත හැකිය. සංචාරක මාර්ගෝපදේශකවරයකු මැනවින් තම සේවය ඉටු කිරීම තුළින් සංචාරකයා හරහා කටින් කට යන ප්‍රචාරය (Publicity by mouth) අද ශ්‍රී ලංකාව පිළිබඳව ප්‍රබල ප්‍රචාරක මාධ්‍යයක් වී ඇති බවද අමතක කළ යුතු නොවේ.

1986 සංචාරක මාර්ගෝපදේශක කථිකාචාර්ය නීති සංහිතාව ( (Tourist Guide Lecturers Code 1986) 1966 අංක 10 දරණ ලංකා සංචාරක මණ්ඩල පනතේ 48 (1) වන වගන්තිය යටතේ 1969-08-10 දිනැති අංක 1488/5 දරණ ගැසට් පත්‍රයට සංශෝධිත වශයෙන් 1986 ජූලි 02 වෙනි දින නිකුත් කරන ලද අංක 408/8 දරණ ඇති විශේෂ ගැසට් පත්‍රයට අනුකූලව ' සංචාරක මාර්ගෝප දේශක' යන්න පහත දැක්වෙන අයුරින් අර්ථකථනය කර ඇත. ' සංචාරක මාර්ගෝපදේශක' යන්නෙන් ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් සඳහා සංචාරකයන් කැටුව යමින් සංචාරකයන් උනන්දුවක් දක්වන ශ්‍රී ලංකාවේ විවිධ අංශ සම්බන්ධයෙන් ඔවුනට කරුණු පැහැදිළි කිරීම් සහ විස්තර සපයන කවර හෝ තැනැත්තෙක් අදහස් වේ.

එම විශේෂ ගැසට් පත්‍රයේ 1 හා 2 යන වගන්ති යටතේ දක්වා ඇති පරිදි නිසි බලධාරියා (වර්තමානයේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්) විසින් 1986 සංචාරක මාර්ගෝපදේශක කථිකාචාර්ය සංහිතාවේ දැක්වෙන විධිවිධාන යටතේ ලියාපදිංචි කොට සහ බලපත්‍ර නිකුත් කරනු ලැබ ඇත්නම් මිස, කිසිදු තැනැත්තෙකු සංචාරක මාර්ගෝපදේශකවරයකු වශයෙන් කටයුතු කිරීම හා සංචාරක මාර්ගෝපදේශකයෙකුගේ කාර්යභාරය ඉටු නොකළ යුතු බවද පැහැදිළිකර තිබේ.

එම විශේෂ ගැසට් පත්‍රයේ 18 (1) 18 (2) හා 19 යන වගන්ති අනුව 1986 සංචාරක මාර්ගෝපදේශක කථිකාචාර්ය

සංහිතාවේ විධිවිධාන යටතේ සංචාරක මාර්ගෝපදේශකයෙකු වශයෙන් ලියාපදිංචි වී බලපත්‍ර ලබා ගෙන ඇත්නම් මිස, කිසිම තැනැත්තෙකු විසින් අදාළ ලියාපදිංචි බලපත්‍ර ලත් සංචාරක මාර්ගෝපදේශකයකු බව ඇඟවෙන අන්දමේ යම් නාමයක්, පදවි නාමයක් හෝ එකතු කිරීමක් ඇතුව හෝ සේවා සැපයීම නොකළ යුතු බවත් දක්වෙන අතර, එම නියෝගයේ විධිවිධාන කඩ කරනු ලබන සෑම තැනැත්තෙකුම වරදකට වරදකරුවකු වන බවත්, එම වරදට වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ එම දඩය සහ ඒ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම යටත්විය යුතු බවත් දක්වා තිබේ.

මීට අමතරව 2005 අංක 38 දරණ සංචාරක කටයුතු පනතේ 48 (4) වගන්තිය අනුව කිසිදු සංචාරක ව්‍යවසායක් හෝ සංචාරක සේවාවක් ව්‍යාපාර කරගෙන යාමේදී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි නොකර හෝ බලපත්‍රයක් නිකුත් කරනු නොලැබූ ව්‍යාපාර කරගෙන යනු ලබන යම් සංචාරක ව්‍යවසායක් හෝ සංචාරක සේවාවක් එම පනත යටතේ වරදකට වරදකරුවකු වන බවද දක්වේ. මෙම පනත මගින් සංචාරක මාර්ගෝපදේශක සේවාවක් පවත්වාගෙන යාම සඳහාද ලියාපදිංචි වී විධිමත් බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍යවන බවද සනාථ වේ.

1986 සංචාරක මාර්ගෝපදේශක කථිකාචාර්ය නීති සංහිතාවට අනුකූලව ශ්‍රී ලංකාවේ දී සංචාරක මාර්ගෝප දේශකයන් සඳහා කාණ්ඩ හතරක් යටතේ බලපත්‍ර නිකුත් කෙරේ. එනම්

අ) ජාතික සංචාරක මාර්ගෝපදේශක කථිකාචාර්ය
(National Tourist Guide Lecturer)

ආ) සංචාරක රියදුරු මාර්ගෝපදේශක කථිකාචාර්ය
(Chauffeur Tourist Guide Lecturer)

ඇ) ප්‍රාදේශිය සංචාරක මාර්ගෝපදේශක කථිකාචාර්ය
(Area Tourist Guide Lecturer)

ඈ) ස්ථානීය සංචාරක මාර්ගෝපදේශක කථිකාචාර්ය
(Site Tourist Guide Lecturer)

මෙහිදී ජාතික සංචාරක මාර්ගෝපදේශක කථිකාචාර්යවරුන්ට මුළු දිවයිනේම සංචාරක මාර්ගෝපදේශක සේවා පවත්වාගෙන යාම සඳහා බලය පවරා දෙනු ලබන අතර, සංචාරක රියදුරු මාර්ගෝපදේශක කථිකාචාර්යවරුන්ට මුළු දිවයිනේම සංචාරක මාර්ගෝපදේශක සේවා පවත්වාගෙන යා හැකි වුවද, ඔවුන්ට කැටුව යා හැකි සංචාරකයන්ගේ සංඛ්‍යාව හත්දෙනෙකුට සීමා කර තිබේ. ප්‍රාදේශීය සංචාරක මාර්ගෝප දේශක කථිකාචාර්යවරුන්ගේ සේවා පවත්වාගෙන යාම එක් නියමිත ප්‍රදේශයකට පමණක් (එනම් නියමිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට, දිස්ත්‍රික්කයකට හෝ පළාතකට) සීමා කර ඇති අතර, ස්ථානීය සංචාරක මාර්ගෝප දේශක කථිකාචාර්යවරුන්ට තම සේවා කටයුතු පවත්වාගෙන යා හැක්කේ සීගිරිය, මිහින්තලේ, ගාළු කොටුව වැනි එක් නියමිත ස්ථානයක් ඇතුළත පමණි.

**සංචාරක මාර්ගෝපදේශකයෙකුගේ කාර්යභාරය :-**




සංචාරකයන් අතර සාමාන්‍ය පිළිගැනීම වනුයේ සංචාරක මාර්ගෝපදේශකයෙකු රජයේ හෝ පෞද්ගලික අංශයේ චාරිකා ආයතනයක සේවා නියුක්තිය ලබා ඇත්තකු ලෙසිනි. කෙසේ වුවද, ශ්‍රී ලංකාවේදී සංචාරක මාර්ගෝ පදේශකයෙකු විධිමත් පුහුණුවක් ලබා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය (ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය) වෙතින් ලියාපදිංචි වී බලපත්‍ර ලබා විධිමත්ව සේවා සම්පාදනය කරනු ලබන සංචාරක මාර්ගෝපදේශකයෙකු වීම ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ තිරසාර සංවර්ධනය උදෙසාද ඉතා වැදගත්ය.

සංචාරක මාර්ගෝපදේශකවරයකු විවිධාකාරයෙන් සුදුසුකම් ලත් බුද්ධිමත් අයෙකු වීම ඉතා අත්‍යවශ්‍ය කරුණකි. රටේ හෝ සංචාරය කරන ප්‍රදේශයේ ඓතිහාසික හා භූගෝලීය පසුබිම, දේශගුණික තත්වයන්, මිනිස් ක්‍රියාකාරකම්, ආර්ථික කටයුතු, ආගමික ඇදහීම්, සංස්කෘතික හා සාමාජීය පසුබිම, චාරිත්‍ර වාරිත්‍ර හා සම්ප්‍රදායන් ආදී සියල්ල පිළිබඳ මනා දැනුමක් හා අවබෝධයක් මෙන්ම සංචාරකයා කථාකරන භාෂාව පිළිබඳ නිපුනතාවයක් ද සංචාරක මාර්ගෝපදේශකයෙකු සතුව තිබිය යුතුය.

සංචාරක මාර්ගෝපදේශකයෙකුට පැවරෙන ප්‍රධාන කාර්යභාරය වන්නේ සංචාරකයෙකු තම රටේ සංචාරක ආකර්ෂණය ඇති ස්ථාන කරා කැටුව ගොස් එම ස්ථානයන් පිළිබඳව අර්ථකථනය කිරීම වශයෙන් සාමාන්‍යයෙන් සැලකුනද ඉන් ඔබ්බට දිවෙන කාර්යභාරයක්ද සංචාරක මාර්ගෝපදේශකයා වෙත පැවරී ඇති බව අමතක කළ යුතු නොවේ.

මුලින්ම සංචාරකයා හෝ සංචාරක කණ්ඩායම ගුවන්තොටුපලේදී පිළි ගැනීමෙන් නැතහොත් මුල් වතාවට දැන හඳුනා ගැනීමෙන් පසු දිවයිනෙහි ගතකරන කාලය තුළ මැනවින් ඔවුන්ට තම සේවය ලබාදී ඔවුන් නැවත ආපසු ගුවන්තොටුපල තෙක් හැරලීම තෙක් වූ කාලසීමාව තුළ සංචාරක මාර්ගෝපදේශකවරයා විසින් ඉටුකළ යුතු කාර්යභාරය සමහර විට මේ යැයි නිශ්චිතව සලකුණු කර තිබීමටද හැකියාවක් නොමැති තරම්ය.

චාරිකාවට එකතුවන සංචාරක කණ්ඩායම රැක බලා ගැනීම ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකරදීම, චාරිකාව සංවිධානය කිරීම හා මෙහෙයවීම චාරිකාවේදී අදාල තොරතුරු හා අර්ථකථනයන් ලබාදීම, සංචාරකයින්ගේ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ලබාදීම, සංචාරකයන් දිවයිනට රැගෙන ආ සමගම සමග අඛණ්ඩව සම්බන්ධතා පවත්වාගෙන යාම, සංචාරකයන් හා ඔවුන්ගේ බඩු බාහිරාදියෙහි ආරක්ෂාව සැලසීම, හදිසි අවස්ථාවක් පැන නැගුණුවිට ඒ පිළිබඳව ක්ෂණික පියවර ගැනීම, සංචාරකයන්ගේ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම, අවහිරයකින් තොරව සංචාරකයන් ප්‍රවාහන, නවාතැන් හා ආහාරපාන පහසුකම් සැලසීම හා අවසාන වශයෙන් චාරිකාව අවසන සංචාරකයින් ගුවන් තොටුපල වෙත හැරලා සමුගැනීම ආදිය මූලික වශයෙන් සංචාරක මාර්ගෝපදේශකයෙකු විසින් ඉටුකළයුතු කාර්යභාරය අතරට ගැනේ.

මෙහිදී සංචාරක මාර්ගෝපදේශකවරයාට චාරිකා උපදේශකවරයෙකු, තොරතුරු සපයන්නෙකු, සංවිධායකයෙකු, චාරිකා මෙහෙයුම්කරුවෙකු හා සංචාරකයන් උනන්දුකරන්නෙකු වශයෙන් බහුවිධ කාර්ය භාරයක් ඉටු කිරීමට සිදුවේ.

**සංචාරක මාර්ගෝපදේශකයෙකු සතුවිය යුතු ගුණාංග :-**

තම රට නියෝජනය කරමින් නිළ නොලත් තානාපතිවරයෙකුගේ සේවාවක් විදේශ සංචාරකයින්ට ඉටුකරනු ලබන සංචාරක මාර්ගෝපදේශකයකු තුළ පහත දක්වෙන ආකාරයේ අධ්‍යාත්මික, බුද්ධිමය හා වෘත්තීමය වශයෙන්ද ගුණාංග රැසක් වර්ධනය කර තිබිය යුතුය.

1. අධ්‍යාත්මික ගුණාංග -
අවංකකම, නිහතමානීකම, අභිමානය, විශ්වාසවන්තභාවය

2. බුද්ධිමය ගුණාංග -
තොරතුරු ඒකරාශීකර ගැනීමට උනන්දුව හා තම රට පිළිබඳව තොරතුරු හොඳින් දැන ගැනීම

3. වෘත්තීමය ගුණාංග -
අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව, නිවැරදි හා හදිසි තීරණ ගැනීමේ හැකියාව, තමන්ගේ සංචාරක කණ්ඩායම සංවිධානාත්මකව මෙහෙයවීමේ හැකියාව, අවශ්‍යවන කවර විෂයක් පිළිබඳව වුවද මැනවින් තොරතුරු සැපයීමේ දැනුම හා හැකියාව, තොරතුරු කියාදීමේදී සංචාරකයන්ගේ අවධානය රඳවා ගැනීමේ හා ඔවුන් නිවැරදිව ස්ථානගත කර ගැනීමේ හැකියාව.

**සංචාරක මාර්ගෝපදේශකයෙකුගේ හැසිරීම් රටාව :-**

සංචාරකයන් සමග කටයුතු කිරීමේ දී හා තොරතුරු ප්‍රකාශ කිරීමේ දී සිත් ඇද ගන්නා සුළු හැසිරීම් රටාවකින් සංචාරක මාර්ගෝපදේශකයා සමන්විත විය යුතුය. පහත සඳහන් කරුණු පිළිපැදීමෙන් හා ඒ අනුව අනුගතවීමෙන් ස්වකීය චර්යාධර්ම වර්ධනයකර ගැනීමට සංචාරක මාර් ගෝපදේශකයකුට නිතැතින්ම හැකිවන බව සිහිපත් කළ යුතුය.

1. තමාගේ හැසිරීමෙන් තම රටේ ප්‍රතිරූපය පිළිඹිඹු වන බව සැමවිටම සිහිතබා ගත යුතුය.
2. පියකරුව පිරිසිදුව හා චාම් ලෙස ඇඳුම ඇඳීම.
3. පෞද්ගලික ස්වස්ථතාවය පිළිබඳව නිතරම සැලකිලිමත් වීම. (දත් මැදදී, ස්නානය කිරීම, පිරිසිදුව සිටීම ආදිය)
4. සැමවිටම යහපත් ගුණාංග පෙන්නුම් කරන්න.
5. හදිසි අවස්ථාවකදී කලබල නොවීම. සිහි බුද්ධිය එලවා කටයුතු කිරීම.
6. ඔබගේ හැසිරීමෙන් අනවශ්‍ය ලෙස සේවා දායකයන්ට (සංචාරකයන්ට) ලංවීමට උත්සාහ නොගැනීම.
7. තම රටේ සමාජයේ මුල් බැසගෙන තිබෙන නීති රීති, චාරිත්‍ර වාරිත්‍ර හා සම්ප්‍රදායන්ට නිතරම ගරුකිරීම. තම සේවාදායකයන්ද එම නීති රීති ආදියට ගරු කරන බවට වගබලාගැනීම.
8. තම සේවා දායකයන්ගේ (සංචාරකයන්ගේ) රටවල් ඔවුන්ගේ ඇදහිලි චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳව වැරදි ආකාරයේ ප්‍රකාශ කිරීම්වලින් වලකින්න.
9. තමා සමඟ චාරිකාවේ යෙදෙන සැම සංචාරකයෙකුටම අඩු වැඩියක් හෝ වෙනසක් නොමැතිව එකසේ සැලකීම.
10. සංචාරකයන් සමඟ තම පෞද්ගලික ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කිරීමෙන් වැලකීම.
11. තමාගෙන් යම් අතපසුවක් සිදුවී නම් පිළිගැනීම සහ ඒවා වසා දැමීමට අසත්‍ය හේතු දීමෙන් වැළකීම.
12. සාමාන්‍ය ජීවියේදී ඇබ්බැහි වී ඇති අයහපත් පුරුදු හැකි තරමින් සංචාරකයන් සමඟ චාරිකාවේදී වලක්වා ගන්න.
13. කිසිදු විටක තම සේවා දායකයන් ගෙන් (සංචාරකයන්ගෙන්) මුදල් ආධාර ඉල්ලීමෙන් වැළකීම.
14. සැමවිටම තම සේවා දායකයන් සමග මිත්‍රශීලී හා විනෝද ජනක චාරිකාවකට මඟ පාදාගැනීම.
15. සැමවිටම පරිසර සංරක්ෂණය හා පවිත්‍රතාවය පිළිබඳව සැලකිලිමත් වීම.

මීට අමතරව නියමිත වේලාවට වැඩ කිරීම හා වේලා කළමනාකරණයද සංචාරක මාර්ගෝපදේශකයකුට ඉතා අත්‍යවශ්‍ය අංගයකි.

අවසාන වශයෙන් නිතර මුවරැඳි සිනහවෙන් යුතුව සංචාරකයන්ගේ අවශ්‍යතාවයන්ට මැනවින් ඇහුම්කන් දෙමින් හා ඒ අවශ්‍යතාවයන් නිසියාකාරව සපුරාලමින් සංචාරකයාට අවශ්‍ය තොරතුරු නිවැරදිව සපයා දෙමින් තම සේවා දායකයන් වන සංචාරකයන් සමඟ යහපත් සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම තුළින් එම සංචාරකයන් නැවත නැවතත් තම රටට ගෙන්වා ගැනීමට සාර්ථක සංචාරක මාර්ගෝප දේශකවරයෙකුට හැකියාව ලැබේ. එසේම සංචාරකයා ආගන්තුකයකු සේ පිළිගෙන මිතුරකු සේ සමුගන්න යන්න සැම සංචාරක මාර්ගෝපදේශකයකුගේම හේතු පාඨය විය යුතුය.

**යූ. පී. එස්. පතිරණ**
Msc.in Tourism (U.K.)
BA (Sri Lanka) NTGL



# නිර්මාණශීලි හා ඵලදායී සේවකයින් බිහිවීමට මග පාදන



# සේවක අභිප්‍රේරණය

**ඊ.ඒ.ඩී. සම්පත් උදයංග**
Bsc (Natural Science).
MBA (Master of Business Administration),
Dip,Network Engineering,
Dip.IT Accounting, Cert. IT (H&S )
සහකාර ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය - නාවල

ඕනෑම රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක් නිවැරදි ලෙස පවත්වාගෙන යාමට දර්ශනයක් මෙහෙවරක් හා පරමාර්ථ/අරමුණු යන සංකල්ප ඉතා වැදගත් වේ. තරගකාරී වෙළඳාම් පරිසරය තුළ ස්ථාවරභාවය පවත්වාගෙන යාමට එනම් ඵලදායීතාවය වැඩිකර ගැනීමට නිවැරදි දර්ශනයක් තිබිය යුතුය. එසේම ආයතනයේ ඵලදායීතාවය හා කාර්යක්‍ෂමතාවය වැඩිකරගැනීමට එහි සේවකයින්ගේ දායකත්වයද ඉතා වැදගත්ය.

ඕනෑම ආයතනයක අභ්‍යන්තර පරිසරයේ එම ආයතනයට අනුගත අභ්‍යන්තර සංස්කෘතියක් පවතී, එලෙසම ආයතනයේ අභ්‍යන්තර සංස්කෘතිය හා පරිසරය බාහිර පරිසරයේ තිබෙන සංස්කෘතිය සමග සමගාමීව ක්‍රියාකරයි. සාර්ථක ආයතනයක් ඉහළ ගුණාත්වයකින් යුත් නිෂ්පාදනයක් ලබා ගැනීම සඳහා සේවකයාගේ මුලු ධාරිතාවයම ආයතනය වෙත උකහා ගත යුතුය. බාහිර පරිසරය හා තරග කිරීමට හැකි නිර්මාණශීලී නව නිපැයුම් සේවකයා ගෙන් බිහිකර ගැනීමට හැකිවිය යුතුයි. ඒ සඳහා මනා කළමනාකාරීත්වයකින් හා පරිපාලනයකින් යුක්තව ආයතනයේ මානව සම්පත කළමනාකරණය කරගත යුතු වෙයි.

මෙහිදී සේවකයින් විසින් දැඩි උනන්දුවකින් කැපවීමෙන් හා නිර්මාණශීලි ලෙස වැඩ කිරීමට නම් සේවකයා තුළ ආයතනය වෙත දැඩි ලෙන්ගතුකමක් තිබිය යුතුය. එසේ වන්නේ ආයතනය විසින් ද සේවකයා වෙත නිවැරදි අයුරින් සැලකීමෙනි (Treat). එහිදී ආයතනයේ තිබෙන විවිධ අංශවල ඉහළ නිලධාරීන්ගේ සිට කළමනාකරණ පිරමීඩයේ පහළ නිළධාරීන් දක්වා තමා විසින් ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් නිවැරදිව ඉටුකළ යුතු වේ. එසේම තමා යටතේ සිටින සේවකයින්ට සමානව හා සාධාරණත්වයෙන් යුතුව සැලකීම ද විය යුතුය. මෙහිදී සේවකයින් අභිප්‍රේරණය වන ආකාරයට ඔවුන්ව මෙහෙයවීම සිදුවිය යුතුය.

සේවක අභිප්‍රේරණය යනු ආයතනයේ අරමුණු ළඟාකර ගැනීම සඳහා අභ්‍යන්තර හා බාහිර සාධක උත්තේජනය වන අයුරින් විභව ශක්තියකින් යුක්තව උනන්දුවකින් හා නොකඩවා තමන්ගේ රැකියාවේ නියුතු වීම සඳහා සේවකයින්ට දිරි දීමයි.

මේ සඳහා විවිධ ක්‍රම ආයතනවල භාවිතා කරයි.
ඒවා නම්,




### දිරි දීමනා ලබා දීම

ආයතනයේ සේවකයන්ට පුද්ගල දීමනා හා කණ්ඩායම් දීමනා (Individual & Group Incentives) ලබා දීම සිදු කරනු ලැබේ. එය අභිප්‍රේරණය වැඩිකර ගැනීමට ඉවහල් වේ. මෙලෙස මූල්‍ය දිරි දීමනා ලෙසට (Cash Prize, Gift Cards, Restaurant Gift Certificates) හා මූල්‍ය දිරි දීමනා ලෙසට අතිරේක නිවාඩු දින ලබා දිය හැකි වේ.

### සේවකයින්ගේ හඳුනාගත් ජයග්‍රහණ (Recognized Achivement)

ආයතන තුළ ඉලක්ක නිවැරදිව හා කාලානුරූපීව ඉෂ්ඨකරගත් සේවකයින් අගය කිරීම, ඔවුන්ට සම්මාන පිරිනැමීම තුළින් ඔවුන්ගේ ධෛර්ය හා උනන්දුව තව තවත් වැඩිවීම සිදුවේ. එහිදී සේවකයන්ට ඔවුන්ගේ කාර්යය අගය කරමින් සහතික පත්‍ර ප්‍රදානය කිරීම, පුවත්පත් තුළ ප්‍රසිද්ධිය ලබා දීම, නිවේද නිකුත් කිරීම, ආයතනයේ Web site තුළ ඉඩක් ලබාදීම හා ආයතනය තුළ බැනර් ප්‍රදර්ශනය කිරීම මෙමගින් සිදුකරනු ලබයි.

### ලාභ හුවමාරු කිරීම (Profit Sharing)

කණ්ඩායම් හැඟීමෙන් වැඩකිරීම තුළින් ආයතනයේ ආදායම හා ඵලදායීතාවය වැඩිකිරීම, ඒ තුළින් ආයතනයේ සේවකයින්ට ආයතනයේ ලාභ හුවමාරු කිරීම මගින් සේවකයා ආයතනය හැර යාම අවම කර ගත හැකි අතර සේවකයින්ට ආයතනයේ අධිකාරීත්වය සම්බන්ධ හිමිකමක් ඇති වේ. මේ නිසා ආයතනයට සේවකයාගේ බැඳීම ශක්තිමත් වන අතර ඔහුගේ / ඇයගේ ආයතනයට ඇති කැපවීම වැඩි වේ.

### සේවකයින්ගේ අධ්‍යාපනය දියුණු කිරීම (Provide the Professional Environment)

ආයතනය විසින් ආයතනයේ පරිසරයට සරිලන ලෙස සේවකයින්ට අධ්‍යාපනය හැදෑරීමට ඉඩ ප්‍රස්ථා සලසා දීම, අධ්‍යාපනික පංතිවලට යාමට අවස්ථාව සලසා දීම, ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීම, සේවකයින් වැඩමුළු සඳහා සහභාගීකර වීමට, යෝග්‍ය පුහුණු පාඨමාලා සඳහා සහභාගී වීමට ධෛර්ය දීම හා නිවැරදි පුහුණු කිරීම් ලබා දීම කළ යුතු වේ. මෙමගින් සේවකයින්ගේ වෘත්තීය මට්ටම සංවර්ධනය වීම ආයතනයේ කාර්යක්‍ෂමතාව වැඩි වීමට ඉවහල් වේ.

### රැකියා සුරක්ෂිතතාවය (Job Security)

ඕනෑම ආයතනයක සේවකයකු තමාගේ

රැකියාවේ ආරක්ෂාව ප්‍රමුඛ සාධකයක් ලෙස සලකයි. එනම් තාවකාලික පදනමින් බඳවා ගන්නා සේවකයා නිරන්තරයෙන් තමාගේ රැකියාවේ ආරක්ෂාව ගැන සැලකිලිමත් වේ. ඒ නිසා කාර්යක්ෂමව සේවය ලබා ගැනීමට නම් ස්වාමියා විසින් සේවකයින් නිවැරදි කාලයේදී ස්ථිර කළ යුතු වේ. එහිදී සේවකයාට ආයතනයේ ප්‍රධානියා හා ආයතනය සම්බන්ධයෙන් විශ්වාසයක් ගොඩ නැගීමෙන් ආයතනයට ලැදිව සේවයේ යෙදෙයි.

**වෙනත් කරුණු**

සේවකයින්ගේ තෘප්තිමත්භාවය රඳාපවතින ප්‍රධාන සාධකය වන්නේ සේවකයින්ගේ වේතනය හා අනිකුත් මූල්‍ය දීමනායි. රැකියාවක් සොයන සෑම විටම වේතනය ඉහළ ප්‍රමාණයකින් ගෙවන ආයතනය කරා යොමු වේ. ඒ නිසා ඉතා ඉක්මනින් කෙටි කාලවල රැකියාවෙන් ඉවත්වී වෙනත් ආයතනවලට බැඳීම සිදු වේ. මෙය ආයතනයක නිෂ්පාදනයට සෘජුව බලපායි. ඒ නිසා බොහෝමයක් ආයතන සේවකයින්ගේ රඳාපැවැත්ම ගැන සලකා බලයි. එහිදී වැඩි වේතනයක් ලබා දීම. අතිකාල දීමනා හා කාලය වැඩිකිරීම දීර්ඝ කාලීන හා කෙටි කාලීන දීමනා ලබා දීම, නිවැරදි වේලාවට ඉලක්ක සපුරා ගත් විට බෝනස් ලබා දීම කළ යුතුයි.

එලෙසම සේවකයින්ගේ පෝෂණ තත්ත්වයන් දියුණු කිරීමට උදේ ආහාරය, දිවා ආහාරය, රාත්‍රී ආහාරය ලබා දීම හා ආහාර දීමනා ලෙස පහසුකම් සලසා දීම සිදු කරනු ලබයි. එලෙසම නිසි වේලාවට වැටුප් වර්ධක ලබා දීම හා වැටුප් වර්ධකවල ප්‍රමාණය වැඩිකිරීමට ද වග බලා ගතයුතුය. කළමනාකරණ මට්ටමේ රැකියාවල නිරතවූවන්ට වාහන සැපයීම, ආනයන වාහන සඳහා බලපත්‍ර ලබා දීම, ඉන්ධන දීමනා ලබා දීම, දුරකථන සඳහා ගෙවීම් ලබා දීම, නවාතැන් පහසුකම් සඳහා යෝග්‍ය ස්ථාන සපයා දීම, නිවාස සෑදීම සඳහා නිවාස ණය ලබා දීම (අඩු පොළියට) හා වෛද්‍ය රක්ෂණාවරණ සපයා දීම හා සේවකයින්ගේ පෞද්ගලික ජීවිතය ගැනද ගැඹුරට සොයා බැලීමද සිදු කරනු ලබයි.

ඉහළ කළමනාකාරීත්වයේ සිට පහළ කළමනාකාරීත්වය දක්වාත් පහළ කළමනාකාරීත්වයේ සිට ඉහළ කළමනාකාරීත්ව දක්වා නිවැරදි සන්නිවේදනයක් පැවතීම ආයතනයේ නිවැරදි කළමනාකරණයට, මෙහෙයුම් කළමනාකරණයට හා නිවැරදි තීරණ ගැනීමට ඉතාමත් යෝග්‍ය පසුබිමක් සලසයි. මෙහිදී සේවකයින්ගේ ආකල්ප ආයතනයට සෘජුව හා වක්‍රව බලපෑම් එල්ල කරයි. ආයතනයක විවිධ ආගම්, විවිධ ජාතීන් හා විවිධ සංස්කෘතීන් ගෙන් හෙබි සේවක පිරිසක් සිටින විට ඔවුන්ගේ ආකල්ප එකිනෙකට වෙනස් වේ. එනිසා තීරණ ගැනීම මගින් ආයතනයට හිතකර ධනාත්මක ආකල්ප කෙරෙහි යොමු වීමටත් සෘණාත්මක ආකල්ප උපුටා දැමීමටත් වගබලා ගැනීම සේවා යෝජකයාගේ වගකීමක් වේ. එසේම ධනාත්මක ආකල්ප මගින් ආයතනයේ ඵලදායීතාව වැඩිකිරීමට ධෛර්යය ලබා දිය යුතුය. සෘනාත්මක ආකල්ප හඳුනාගෙන ඒවා ඉවත්කර ගෙන ආයතනයේ අරමුණු වලට යෝග්‍ය ආකල්ප පමණක් පදනම් කරගෙන සේවයේ යෙදීමට ධෛර්යය ලබා දිය යුතු වේ.

එලෙසම සේවකයකු නිවැරදිව රැකියාවේ නිරත වන විට ඔවුන්ව වාචිකව අගය කිරීම ද සේවකයා තෘප්තිමත් වන කරුණක් වේ.

සේවකයන්ගේ දිනපතා පැමිණීම ආයතනයේ කාර්යක්ෂමතාවයට බලපෑම් කරයි. බහුතරයක් සේවකයන් නිවාඩු, අර්ධ නිවාඩු, කෙටි නිවාඩු, වැඩියෙන් ගන්නේ නම් එය ආයතනයට සෘජුවම බලපෑම් එල්ල කරයි. නිෂ්පාදන කටයුතු සිදුකරන ආයතන සඳහා සේවකයින්ගේ නොකඩවා පැමිණීම එම කටයුතු සාර්ථක වීමට ඉවහල් වේ.




වසර අවසානයේ සේවකයන් ඇගයීම, විනෝද චාරිකා සංවිධානය කිරීම, සේවකයා හා සේවා යෝජකයා අතර බැඳීම වර්ධනය කරන ක්‍රියාකාරකම් සංවිධානය කිරීම ද කාර්යක්ෂමතාවයෙන් යුක්ත සේවයක් ලබා ගැනීම සඳහා මග පාදයි. ඔවුනගේ දක්ෂතා එළි දැක්වීමට වේදිකාවක් සලසා දීම තුළින් කණ්ඩායම් හැඟීමෙන් වැඩකරන නිවැරදි නායකත්වයක් දැරීමට සුදුසු පුද්ගලයින් හඳුනා ගත හැකි වේ. ප්‍රමිතියකින් යුත් ගුණාත්මකතාවයෙන් යුතු නිෂ්පාදන හා සේවාවන් ලබාදීමට මෙම කරුණු ඉවහල් වේ.

වර්තමානයේ තාක්ෂණය හා විද්‍යාව ඉතා සීග්‍රයෙන් යාවත්කාලීන වෙමින් පවතින නිසා තරගකාරී ලෝකයට පිවිසීමේ දී ආයතනයකට උපක්‍රම හා ක්‍රමවේද අනුගමනය කිරීමට සිදුවේ. එබැවින් නිවැරදි තාක්ෂණික කරුණු ආයතනයකට උකහා ගැනීම සිදුවේ. මෙහිදී සේවකයන් ඒ සඳහා යොමු කිරීමත් නිවැරදි පුහුණු අවස්ථා ලබා දීමත් අනිවාර්ය වේ. විදේශීය පුහුණු වීම් සඳහා ද යොමු කළ යුතු වේ. එමගින් සේවකයාගේ දක්ෂතාව ඔප්නැංවෙන අතරම ආයතනයේ අභිවෘද්ධියට ද එය හේතු සාධකයක් වේ.

උක්ත කරුණු සියල්ලම ආයතනය විසින් සේවකයාට ලබා දිය යුතු වරප්‍රසාද හා යුතුකම් වේ. සේවකයා විසින් ආයතනය වෙත ලබා දෙන දායකත්වය ද ඉතා වැදගත් වේ. ආයතනයේ ප්‍රධාන අරමුණු, පරමාර්ථ, මෙහෙවර හා දර්ශනය ඉටුකර ගැනීමට සැබෑ දායකත්වයක් සේවකයා විසින් ලබා දිය යුතුය. එහිදී ආයතනයේ දීර්ඝකාලීන හා කෙටිකාලීණ අරමුණු ඉහළ කළමනාකාරීත්වය විසින් මෙහෙයුම් කළමනාකාරීත්වයට පැවරීමේ දී සියළුම සේවකයින් මෙම අරමුණු සාර්ථක කර ගැනීමට කැපවී සිටියි. දෛනික ඉලක්ක, මාසික ඉලක්ක හා වාර්ෂික ඉලක්ක නිසි වේලාවට සම්පූර්ණ කිරීම සේවකයාගේ වගකීමයි. ආයතනයේ නීති රෙගුලාසිවලට අනුව කටයුතු කිරීම, ආයතන ප්‍රධානීන් පවරන කර්තව්‍යයන් නිසි අයුරින් ඉටු කිරීම සේවකයින්ගේ ප්‍රධාන වගකීමක් වේ.

**සේවකයින්ගේ අභිප්‍රේරණ ක්‍රමවේදයන් යටතට,**

1. රැකියා සැලසුම් නිර්මාණය කිරීම (Job Design)
2. Rewards
3. සේවක සහභාගීත්වය (Employee participation)
4. ගුණාත්මක වැඩ ජීවිත වැඩසටහන් ලෙස විස්තර කළ හැක.

## 1. Job Designing

සේවක අභිප්‍රේරණයේදී රැකියා සැලසුම් නිර්මාණය කිරීම ඉතා වැදගත්ය. සේවකයින් සඳහා රැකියා සැලසුම් කිරීම, අභියෝග හා උනන්දුව ඇති කිරීමට ඉවහල් වේ. රැකියාවේ උනන්දුව, උත්සාහය, කාර්යක්ෂමතාව වර්ධනයට ද හේතු වේ.

**Job Designing** කිරීම කරුණු 4 ක් යටතේ සිදු වේ.

- රැකියා සරල කිරීම - Job Simplification

මෙහි අරමුණ වනුයේ රැකියාවේ ප්‍රමිතිය හා විශේෂිකරණය ඇති කිරීමයි

- රැකියාව ප්‍රසාරණය කිරීම - Job Enlargement

මෙහි අරමුණ වනුයේ රැකියාවේ පුළුල් බව ඇති කිරීමත් කාර්යයන් එකිනෙකට



සම්බන්ධකරණය කරමින් වැඩබිමේ සේවකයාගේ රැකියාවේ විවිධත්වය වැඩි කිරීමයි.

- රැකියා මාරු කිරීම - Job Rotation

මෙහි අරමුණ වනුයේ කාලානුරූපීව සේවකයින්ව විවිධ කාර්යයන් සඳහා වැඩබිමේ විවිධ ස්ථානවලට යොමු කිරීමයි.

- රැකියාවේ පෝෂණීයත්වය - Job Enrichment

අභිප්‍රේරණ කරුණු උපයෝගී කරගනිමින් මූලික රැකියා වර්ධනය කිරීම මෙමගින් අරමුණු වේ.

**2. Rewards**

අභිප්‍රේරකයක් ලෙස Rewards යොදා ගන්නා අතර මෙය ප්‍රධාන වශයෙන් කොටස් 2 කට බෙදේ..

- අභ්‍යන්තර
- බාහිර

අභ්‍යන්තර අභිප්‍රේරණයේ දී සේවකයාගේ මානසික තත්ත්වය වැඩිදියුණු කරනු ලැබේ. බාහිර අභිප්‍රේරණයේ දී තෑගි මුදල් හා දීමනා ලබා දීම සිදු වේ.

**3. සේවක සහභාගීත්වය (Employee Participation)**

ගුණාත්මක පාලන චක්‍රය යොදා ගැනීම මගින් සේවකයින් ගේ සහභාගීත්වය දියුණු කර ගත හැකි අතර මෙම චක්‍රය මගින් සේවකයින්ගේ වැඩබිමේදී ඇතිවන ප්‍රශ්න නිරාකරණයට ද උපකාරී වේ. ඒවා නම්, වියදම් අඩුකර ගැනීම (Reducing Cost), ගුණාත්මක බවට ඇතිවන ප්‍රශ්න අඩුකර ගැනීම (Solving quality problems) නිෂ්පාදන ක්‍රම වැඩිදියුණු කිරීම, සේවක කළමනාකරණ සම්බන්ධතාවය වැඩිදියුණු කර ගැනීමට ඉවහල් වේ. තීරණ ගැනීමේ දී, කණ්ඩායම් අතර මනා සන්නිවේදනයට හා වගකීම් නිසිලෙස ඉටුකිරීමට මෙම සහභාගීත්වය ඉතා වැදගත් සාධකයකි. තවද ආයතනයේ වැදගත් මූල්‍ය දත්ත සේවකයින් අතර නිවැරදි ලෙස හුවමාරු කර ගැනීම හා එමගින් ඔවුනොවුන් අතර විශ්වාසය ගොඩනැගීමෙන් අභිප්‍රේරණය හා නිෂ්පාදනය වැඩිකර ගත හැකි වේ.

**4. ගුණාත්මක වැඩ ජීවිත වැඩසටහන් (Quality of worklife programme)**

සේවකයින්ගේ රැකියා ජීවිතය හා පෞද්ගලික ජීවිතය සමබරතාවයකින් යුක්තව පවත්වාගෙන යාම ඉතාමත් වැදගත්ය. එහිදී රැකියාවේ ප්‍රශ්න අවමකර, පවුල් රැකවරණය හා පෞද්ගලික ජීවිතය නිවැරදි සමබරතාවයකින් පවත්වා ගෙනයාම, සේවක අභිප්‍රේරණය හා ගුණාත්මක බවින් හෙබි නිෂ්පාදන හා සේවා ලබා දීමට මහඟු රුකුලක් වේ. මෙහිදී නම්‍යශීලීත්වය ඉතා වැදගත්ය. ඒ සඳහා Quality of work life programme වැදගත් වේ. එනම් සේවකයන්ට සේවක වැඩබිම ඉතා ප්‍රසන්න වාතාවරණයකින් හෙබි වීම, නම්‍යශීලී කාලයක් ලබාදීම හා සමහර සේවකයින්ට නිවසේ සිටම වැඩෙහි යෙදීමට අවස්ථා සලසා දීම හා සමහර සේවකයින්ට පහසු කාල පරිච්ඡේදයන් ලබා දීම, සේවකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය ගැනද සැලකීම ගුණාත්මක සේවයක් ලබා ගැනීමට ඉවහල් වේ. උපදේශනය ලබා දීම සේවකයින්ගේ වැරදි පුරුදු අවම කර ගැනීමට අවස්ථාව සලසා දෙයි. එලෙසම පවුලේ තත්ත්වයන් ගැන හා පෝෂණය ළමයින්ගේ සුබසාධනය ද, පවුලේ අත්‍යවශ්‍ය වැඩ සඳහා අවසර ලබාදීම ද මෙමගින් සිදු වේ.

වර්තමාන පරීක්ෂණවලින් හෙලිවී ඇති කරුණු අනුව පිරිමින් නිරන්තරයෙන් ඔවුන්ගේ රැකියාවේ තත්ත්වයන් හා ඔවුන්ගේ පෞද්ගලික ජීවිතය ගැනද සැලකිලිමත් වන අතර ගැහැණුන් නිරන්තරයෙන්ම මවකගේ චරිත ලක්ෂණ, බිරිඳකගේ චරිත ලක්ෂණ, දියණියකගේ චරිත ලක්ෂණ හා යහළුවකුගේ චරිත ලක්ෂණ, කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි. මෙම පෞද්ගලික කරුණු කෙරෙහි වැඩි අවධානය යොමු කිරීම ආයතනයේ වගකීම වන අතර ඒවා වැඩි දියුණු වීමෙන් ආයතනයේ ඵලදායිතාවය හා සේවකයින්ගේ අභිප්‍රේරණයට ඉවහල් වේ.

අවසාන වශයෙන් විසි එක්වන සියවසේදී සේවක අභිප්‍රේරණය සම්බන්ධයෙන් විවිධ න්‍යායන් ඉදිරිපත් වී ඇති අතර අභිප්‍රේරණ න්‍යායන් අතරෙන් ඉතා වැදගත් න්‍යායන් ලෙසට මැස්ලෝගේ අවශ්‍යතා ධූරාවලි න්‍යාය (Maslow's theory) හර්බ්ස් න්‍යායය (Herzberg's two-factor theory) ව්‍රෑම්ස්ගේ න්‍යායය (Vroom's expectancy theory) සහ ලෝකස් ගේ අරමුණු න්‍යාය (Lockers goals theory) ප්‍රමුඛත්වයක් දරා කටයුතු කරයි. මෙම න්‍යායන්වලින් ඉතාමත් වැදගත් වූ න්‍යාය ලෙස ප්‍රකට වී ඇත්තේ මැස්ලෝගේ අවශ්‍යතා ධූරාවලි න්‍යායයි.



අවසාන වශයෙන් කිව යුතු වන්නේ සැබෑවටම ගහකට පොත්ත වැදගත් යම්සේ ද සේවක අභිප්‍රේරණය ආයතනයක පැවැත්මට අත්‍යවශ්‍ය සාධකයක් බවයි.

""We can save our life in several days without water but without oxygen we can't live even one movement""

# හදවත සනසන

## හිතමිතුරු සේවය

## ශ්‍රී ලංකා සුමිත්‍රයෝ



ශ්‍රී ට බොහෝ කාලයකට ඉස්සර එංගලන්තයේ පල්ලියක අවමඟුල් උත්සවයක් පැවැත්වුණා. මියගිහින් හිටියේ අවුරුදු දොළහක පුංචි දුවණියක්. හේතුව සියදිවි නසා ගැනීම. ඒ නිසාම එයාගේ අවමඟුල් උත්සවය ගත්තෙ පල්ලියේ වෙනත් තැනක.

මේ පිළිබඳව විපරම් කළ පල්ලියේ පියතුමාට දැනගන්න ලැබුණේ දුක හිතෙන කථාවක්. තමන් මල්වර වුණා කියලා නොදන ඒ පිළිබඳව වැරදි විදියට හිතලා බයවුණු මේ පුංචි දැරිය දිවි නසාගෙන. අනේ ''මේ දැරිය එක්ක මේ ගැන  කථා කරන්න කව්රුහරි හිටිය නම් මේ දේ වෙන්නෙ නෑ,'' පිය තුමාට හිතුණා. ''මීට පස්සේ මම මේ මිනිස්සුගේ ප්‍රශ්නවලට ඇහුම්කන් දෙන්න ඕන'' කියලා තීරණයක් ගත්තා. එදා ඉඳන් පල්ලියට වැල නොකැඩී සෙනග ආවා.  දුක බෙදා ගත්තා. පූජකතුමා සහයට තවත් කාන්තාවෝ කීප දෙනෙක් එකතු කරගත්තා. ඒ අයත් මිනිසුන්ගේ දුකට ඇහුම්කන් දුන්නා. හදවත සනසාගෙන සතුටු  සිතින් ගියා. මේ විදියට තමයි Chad Varah (චැඩ් වාරා) පියතුමා මේ සේවය ආරම්භ කළේ. ඒ කාලේ Befrienders international ලෙසයි එංගලන්තයේ මෙය හැඳින්වූයේ. ශ්‍රී ලංකා සුමිත්‍රයෝ ආයතනය ලංකාවේ ආරම්භවුනේ මීට වසර 41 කට පෙර, ජෝන් ඩිමෙල් මැතිණියගේ ප්‍රධානත්වයෙන්. කෙනෙකුගේ ප්‍රශ්නයකට සක්‍රීයව සවන්දුන්නොත් ඒ කෙනාගේ බර සැහැල්ලුවනවා. නිවැරදිව හා නිරවුල්ව ප්‍රශ්නය දකින්න පුළුවන් වෙනවා. විකල්ප විසඳුම් සාකච්ඡා කරනවා. සක්‍රීය සවන් දීම කියන්නෙ කන් දෙකෙන් පමණක් නොව මනසින්, බුද්ධියෙන් හා හදවතින් සවන්දීමක්, තේරුම් ගැනීමක්, වචනයෙන් නොකියවෙන දේටත් ඇහුම්කන් දීමක්. මේ අරමුණෙන් තමයි මෙය පවත්වන්නෙ. ඕනෑම අයකුගේ තරාතිරම නොබලා සමානව සැලකීමත් රහස්‍යභාවය රැකීමත් විශේෂයි. විශේෂයෙන්ම සියදිවි හානිය අවම කිරීම සඳහා වැඩි බරක් දරනවා.

දේශපාලනය හෝ ආගම් ප්‍රචාරණය නොකිරීමත් කිසිදු ආකාරයක ද්‍රව්‍යමය

හෝ මූල්‍යමය ආධාර නොදෙන ආයතනයක් ලෙසත් කටයුතු කරනවා. නීති ආධාර වෛද්‍ය ආධාර අවශ්‍ය අයට තොරතුරු ලබාදීම සිදුවෙනවා. ඒ වගේම මෙය රජයේ ලියාපදංචි, රාජ්‍ය නොවන සංවිධානයක්.

සුමිත්‍රයෝ ආයතනය එක්ක ලිපි මගින්, email මගින් මෙන්ම දුරකථනයෙනුත් සම්බන්ධ වෙන්න පුළුවන්. සතියේ හැම දිනකම පෙරවරු 9 සිට පස්වරු 4 දක්වා විවෘතයි. සම්පූර්ණයෙන්ම නොමිලේ සේවයක්. මෙහි සිටින ස්වෙච්ඡා සේවකයින් සේවය කරන්නේ ස්වේච්ඡාවෙන්. ඒ අය විශේෂ පුහුණුවීම් ලැබූ අයයි. එවැනි දේට කැමති අයටත් ආයතනය සමග එක්වන්න පුළුවන්. ශ්‍රී ලංකා සුමිත්‍රයෝ ආයතනයෙන් යම් සේවාවක් ලබා ගැනීමට ඔබට අවශ්‍ය නම් පහත ශාඛා ඔස්සේ ඔබට සම්බන්ධ වෙන්න පුළුවන්.



# ශ්‍රී ලංකා සුමිත්‍රයෝ

**ප්‍රධාන කාර්යාලය :**

- 60/76, හෝර්ටන් පෙදෙස, කොළඹ 07
  දු.ක.අංක : 011-2682535
  email : sumithrayo.headoffice@eureka.lk

**ශාඛා :**

- **මහනුවර** - 693/4, පේරාදෙණිය පාර, මුල්ගම්පොල, මහනුවර
  දු.ක.අංක : 081-2234806
  email : sumithrayo.kandy@gmail.com
- **බණ්ඩාරවෙල** - සිංහ සමාජ ගොඩනැගිල්ල, සේනානායක මාවත, බණ්ඩාරවෙල
  දු.ක.අංක : 057-2222662
- **පානදුර** - 578/3, ගාලු පාර, පානදුර
  දු.ක.අංක : 038-2235291
  email : sumithrayopnd@gmail.com
- **මාතලේ** - 03, රජවීදිය, මාතලේ
  දු.ක.අංක : 066-2223521
- **මාවනැල්ල** - ගමගේ රෝහල බාරේ, 121, පාලේගොඩ පාර, මෙඩේරිගම, මාවනැල්ල
  දු.ක.අංක : 035-5788330
  email : slsmawanella@ymail.com
- **මීගමුව** - බෞද්ධ මන්දිරය බාරේ, 95, ග්‍රීන් පාර, මීගමුව,
  දු.ක.අංක : 031-2223322
- **පඩුවස්නුවර** - කුරුණෑගල පාර, හෙට්ටිපොල
  දු.ක.අංක : 037-2291718
  email : sumithrayopaduwas@gmail.com
- **කුරුණෑගල** - 182 සී, කොළඹ පාර, කුරුණෑගල
  දු.ක.අංක : 037-4931731
- **කොහුවල** - 183-1 ඒ, දුටුගැමුණු වීදිය, කොහුවල, නුගේගොඩ
  දු.ක.අංක : 011-2818860
  email : sumithrayokohuwela@gmail.com

**ග්‍රාමීය ව්‍යාපාතිය :**

- **පඩුවස්නුවර** කුරුණෑගල පාර, හෙට්ටිපොල
  දු.ක.අංක : 037-5715815
- **ලුණුගම්වෙහෙර** - 86/98 19, පාලම අසල , නව නගරය, ලුණුගම්වෙහෙර
  දු.ක.අංක : 047-5781200

## රෝසි සේනානායක

>> 15 පිටුවෙන්

ඒ සඳහා විවිධ මනෝමිතික පරීක්ෂණයන් පුද්ගලයාගේ පෞරුෂ ගුණාංග හඳුනා ගැනීමට යොදා ගන්නවා. ඒ වගේම වෙනත් රටවල තරුණ තරුණියන් සම්ප්‍රදායික රැකියාවන්ට පමණක් කොටුවී නැහැ. එම සුබවාදී ආකල්ප අපේ රටේ දරුවන්ටත් ඇති කර දීම හොඳයි. ඒ සඳහා ඔවුන් හැඩගැස්වෙනවා නම් හොඳයි.

සැමවිටම ලෝකයත් එක්ක සිටිය යුතුයි. ඒ සඳහා අවශ්‍ය අන්තර්ජාල පහසුකම් අද ළමයින්ට ලැබී තිබෙනවා. මේ නිසා ජාත්‍යන්තර මට්ටමට ගැළපෙන පරිදි නව දැනුම, කුසලතා, ආකල්ප සකසා ගත යුතුයි. ඉදිරිපත්වීමේ කුසලතා මෙහිදී ඉතා වැදගත්. කොපමණ කුසලතා තිබුණත් එය ලොවට පෙන්වීමට නම් අවස්ථා සොයා යා යුතු වෙනවා. ඒ මගින් තමා නව අවස්ථා හඳුනා ගැනීමට හැකිවන්නේ. ඒ වගේම ගැහැණු ළමයි වුවත් හොඳ ඉගෙනීමක් ලබා ගත යුතුයි. සම්ප්‍රදායික රැකියාවල කොටු වී නොසිට නව රැකියා හඳුනාගත යුතුයි. තම කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කරගත යුතුයි. අසාධාරණයක් වූ විට ඒ සඳහා නැගී සිටිය යුතුයි. අද ලෝකයේ කාන්තාවන් අතර ඉතා ඉහළ තත්ත්වයට පත් වූ අය ඕනෑ තරම් සිටිනවා. හැකියාවන් දක්ෂතාවයන් දියුණු කර ගැනීමට ස්ත්‍රී භාවය බාධාවක් නොවේ.

කෙසේ වෙතත් කාන්තාවක් තම භූමිකාව හඳුනා ගැනීම ඉතා වැදගත්. ඇයට නිවසේ මවක්, බිරිඳක්, ලෙස යුතුකම් හා වගකීම් පවතිනවා. මේ දේවල්වලින් බැහැරව ගිය විට සාර්ථක කාන්තාවක් වන්නට බැහැ. ඒ වගේම එය අනාගත පරපුරටත් බලපානවා. රටේ සංවර්ධනයට බලපානවා. මේ නිසා කාන්තාවක් ලෙස ලෝකයේ ඉදිරියට යන අතරම ගෘහ ජීවිතය ද සමබරව පවත්වා ගත යුතුයි. එවිටයි සාර්ථක වෘත්තිකයකු බිහිවන්නේ.

ළමා කටයුතු පිළිබඳ රාජ්‍ය ඇමතිවරිය ලෙස දරුවන් වෙනුවෙන් විවිධ වැඩ සටහන් රාශියකට සම්බන්ධව ඊට නායකත්වය දෙමින් කටයුතු කරනා රෝසි සේනානායක මැතිණියගෙන් අප සමුගත්තේ කථා කිරීමට බොහෝ දෑ තිබුණත් ඊට කාලය හරස් වූ බැවිනි.



# ජාතික මෝස්තර මධ්‍යස්ථානය

**මෙලොව ඇති හැමදේම නිර්මාණයක්. මනසට ඇතිවන සංකල්පයක් යතාර්ථයක් බවට පත්වන්නේ නිර්මාණයක් තුළිනි. නිර්මාණශීලි හැකියාව මානව පරිනාමයේ සිටම පවතින දෙයකි. ආදි කාලයේ සිට පැවත එන නොයෙකුත් නිර්මාණ, ගුහා චිත්‍ර ආදිය වර්තමානයේ දී ද දැකිය හැකියි. මේ නිසාම තම දරුවන්ගේ සහජයෙන් එන නිර්මාණශීලිභාවයන් දෙමාපියන් ගුරුවරුන් හඳුනා ගැනීම මෙන්ම ඒවාට සහයෝගය ද දිය යුතුයි. ඒ සිතුවිලි යතාර්ථයක් බවට පත්වී අවශ්‍ය දැනුම කුසලතා ලබා දිය යුතුයි. නිර්මාණශීලිභාවය ගත්විට එහි නිරතවන අය මෙන්ම එහි නිරත නොවී ඒ පිළිබඳ අධ්‍යයනය කරන අයද සිටී. මේ සඳහා මහාචාර්ය පරණවිතාන ශූරීන් ඉතා හොඳ උදාහරණයක්.**

ළමයා අතින් මැවෙන විවිධ හැඩතල ස්වාභාවික විය යුතු නැහැ. ඔහුට ඒ සඳහා අවශ්‍ය නිදහසයි. ඒ වගේම මැදිහත් වී සහාය විය යුතුයි. අද පරිගණක තාක්ෂණය ඉතා දියුණුයි. නිර්මාණකරණය සඳහා එය ඉතා හොඳ මෙවලමක්. ලෝකයේ දියුණු රටවල මේ සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති පවා සකස්වී තිබේ. එවිටයි අලුත් නිර්මාණ බිහිවෙන්නේ. මේ කාලයට අවශ්‍ය කුමක්ද කියා තීරණය කිරීමට රජයට දැනුමක් අවශ්‍යයි. සාමාන්‍යයෙන් අපේ රටේ මිනිස්සු හුඟක් නිර්මාශීලියි. ඒ නිසා ඉන් තිසි ප්‍රයෝජන රටක් විදිහට ගත යුතුයි.'

මෙලෙස අප සමඟ අදහස් පල කලේ ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ පුහුණු උපදේශක විජිත බණ්ඩාර මහතායි. නැවුම් මුහුණුවරකින් නිතරම නිර්මාණ බිහිවන්නේ කෙසේද යන්න දැන ගැනීමට මෝස්තර මධ්‍යස්ථානයට අපි යන විටත් තරුණ නිර්මාණ ශිල්පීන් පරිගණක ඇසුරින් නිර්මාණකරණයේ නියැලෙනවා. විවිධ හස්ත කර්මාන්ත සඳහා නැවුම් මෝස්තර එළි දැක්වීමට අන්තර්ජාලයේ සැරිසරමින් නව තාක්ෂණය උපයෝගි කරගනිමින් ඔවුන් එම කාර්යයේ නියෙලෙන විට අපිටත් අලුත් අදහස් බිහිවෙනවා. ජාතික මෝස්තර මධ්‍යස්ථානය පිළිබඳව ඔබත් දැනගන්න කැමති ඇති. මේ ඒ පිළිබඳ සටහනක්...

ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්තය අප රටේ සංස්කෘතිය, ආගම පිළිබිඹු වන අයුරින් අපට ආවේනික වූ කර්මාන්තයක් බවට පත් වී ඇත. නව නිර්මාණ බිහිකර වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම හා විරැකියාව අවම කිරීම සඳහා දැනුම හා උපදෙස් ලබාදීම සිදුවේ. මෙහිදී හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම මූලික කරගෙන හඳුනාගත් ක්ෂේත්‍ර ගණනාවකි. ගෝලීය වෙළෙඳපොළ වෙත හස්ත කර්මාන්ත ශිල්පීන්ට ප්‍රවේශවීමට නම්, නූතන තාක්ෂණය යොදා ගනිමින් ඔවුන්ගේ භාණ්ඩවල ගුණාත්මකභාවය ඉහළ නංවා ගතයුතුය. එවැනි තරගකාරී වෙළෙඳපොළකට ප්‍රවේශ වීමට, භාණ්ඩවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම පමණක් නොව වෙළෙඳපොළ අවශ්‍යතාවය ද හඳුනාගෙන ඇති මෙම ආයතනය ඒ සඳහා අවශ්‍ය නිපුනතාවය සංවර්ධනය කිරීමේ සහයෝගය ලබාදීමට කැප වී ඇත. දේශීය හා ජාත්‍යන්තරව වඩාත් සාර්ථක වෙළෙඳපොළක් නිර්මාණය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරයේ දැවැන්ත පිබිදීමක් මේ තුළින් ලබාගෙන ඇත.

ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය සඳහා ශිල්පීන් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සඳහා හොඳ වෙළෙඳපොළක් ඇති කිරීමට අවශ්‍ය තාක්ෂණය ලබාදීම, නිර්මාණ අධ්‍යාපන වැඩසටහන්, වෘත්තීය නිර්මාණ ශිල්පීන් බිහිකිරීම, සහ ඔවුන්ගේ දක්ෂතාවයන් හා හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා මෙම ආයතනය කටයුතු කරනු ලැබේ. තවද ජාතික මෝස්තර මධ්‍යස්ථානය විවිධ අමුද්‍රව්‍ය යොදා ගනිමින් සීගිරිය, පොළොන්නරුව, දළදා මාළිගාව වැනි ඓතිහාසික වැදගත්කමක් ඇති ස්ථාන සහ සංචාරක මධ්‍යස්ථාන කේන්ද්‍ර කරගෙන ත්‍යාග හා සමරු භාණ්ඩ නිර්මාණ කිරීම සිදුකරනු ලැබේ. මෙම ගින් දේශීය හා විදේශීය වෙළෙඳපොළ

අරමුණු කරගෙන භාණ්ඩ නිෂ්පාදනයට මඟ පෙන්වීමක් කරනු ලැබේ.

මෙම ආයතනය මගින් පහත සඳහන් නිශ්පාදන ආශ්‍රිතව නිර්මාණයන් කරනු ලැබේ.

උණ හා වේවැල් - Bamboo and Cane
පිත්තල - Brass
කොහු - Coir
සම් - Leather
ලාක්ෂා - Lacquer
රතු මැටි - Red Clay
පන් හා කෙඳි - Thread and Reed
රෙදි පිළි - Textiles
දැව - Wood
සිහිවටන - Souvenirs
ළමා විසිතුරු භාණ්ඩ - Kids Items

මීට අමතරව ජාතික මෝස්තර මධ්‍යස්ථානය මගින් අභ්‍යන්තර ගෘහ අලංකරණ පාඨමාලා දෙකක් පවත්වනු ලබන අතර මෙම පාඨමාලා සෙනසුරාදා හා ඉරිදා දිනවල පැවැත් වේ. නිර්මාණ ක්ෂේත්‍රය පිළිබඳ සුදුසුකම් ලබා දීම තුළින් අභ්‍යන්තර ගෘහ අලංකරණයට යොමු කරනු ලැබේ. මේ පාඨමාලාව සඳහා රු. 50000/- මුදලක් අයකරනු ලබන අතර වාරික දෙකක් වශයෙන් ද ගෙවිය හැකිය. මෙහි ශාඛාවක් නුවර ඇත. ගෘහ නිර්මාණය සඳහා මූලික දැනුම හා සා/පෙළ සමත් අයට මූලික ඉංග්‍රීසි/සිංහල මාධ්‍යයෙන් මෙම පාඨමාලා පවත්වනු ලැබේ.

මෝස්තර නිර්මාණකරණය පිළිබඳව පුහුණුව ලබා ගත හැකි වෙනත් බාහිර ආයතන පහත වේ.

1) Sri Lanka Institute of Interior Designers. (SLIID)
www.facebook.com/sliid.lk
2) www.raffles.edu.lk
3) Dilini Halvitigala School of Interior Design
www.facebook.com/dh.designschool
4) Interior Design in Sri Lanka
Raffles Design Institute
Sri Lanka
www.raffles.edu.lk



**උමංගා චාන්දනී**
ව්‍යාපෘති නිලධාරී
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව







## මෝස්තර නිරූපණය

>> 13 පිටුවෙන්

නැත. මේ වනතුරු එවැනි පනත් පැනවීමක් සිදු වී නැත. ඒ හේතුවෙන් හුදෙක් මුදල් ඉපයීමේ පරමාර්ථය පෙරදැරි කරගෙන එකම වසරක් තුළ රූ රැජින තේරීමේ තරග කිහිපයක් පැවැත්වීම දැකිය හැකියි.නමුත් ප්‍රමිතියකින් තොරව මෙවැනි වැඩසටහන් සිදු කිරීම සුදුසු නොවේ. ප්‍රමිතිකරණය යන්න අත්‍යවශ්‍ය කාරණාවකි. අප විසින් ගොඩනගා ගත් සංවිධානයක් මඟින් ප්‍රමිතියක් ඇතිව මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පනතක් ගෙන ඒමට අවශ්‍ය කටයුතු මේ වන විට සැලසුම් කරමින් පවතී.

**මේ ක්ෂේත්‍රය තුළ පරිණත අයකු ලෙස, ඔබ සතු දැනුම ක්ෂේත්‍රය කෙරෙහි ඇල්මක් ඇති නවකයන් වෙත ලබා දීම සඳහා ඔබ විසින් පවත්වා ගෙන යනු ලබන ආයතනය පිළිබඳ හැඳින්වීමක් කළොත්....**

Zsaid Images නමින් මා විසින් පවත්වා ගෙන යනු ලබන ආයතනය මගින් නවකයන් වෙත මෝස්තර නිරූපණ ශිල්පීන්/ ශිල්පිනියන් ලෙස නිවැරදි දැනුමක් ඇතිව ක්ෂේත්‍රයට පිවිසීමටත්, ක්ෂේත්‍රය තුළ පැවැත්මක් ඇතිකර ගැනීමටත් අවශ්‍ය න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික කරුණු සාකච්ඡාවට බඳුන් කෙරේ. ඒ යටතේ නිරූපණ ක්‍රමවේද, ඇඳුම් පැළඳුම් භාවිතය, සන්නිවේදන ක්‍රම, බාහිර අලංකාරය, පෞරුෂ වර්ධනය, ශරීරය නියමිත හැඩයෙන් පවත්වාගෙන යාම, ආහාර පාලනය වැනි ක්ෂේත්‍ර හා තවත් වැදගත් කරුණු ගණනාවක් පිළිබඳ දැනුම ලබා ගැනීමට අවස්ථාව උදා වේ.

ඕනෑම වෘත්තියක් තුළ පැවැත්මක් හා ස්ථාවරබවක් ඇති කර ගැනීමට ඒ පිළිබඳව අධ්‍යයනය කිරීමත් අධ්‍යාපනය ලැබීමත් අත්‍යවශ්‍ය සාධකයන් වේ.

එමෙන්ම තමන්ට ගැළපෙන ක්ෂේත්‍රය හඳුනා ගනිමින් තම අරමුණ සපුරා ගැනීමේ මාවත සැලසුම් කිරීම සාර්ථකත්වයට හේතු වේ. සාම්ප්‍රදායික රාමුවක් තුළ සිර වී, උසස් යැයි සම්මත හුදු වර්ගීකරණයකට ලක් වූ වෘත්තියක වහලුන් වීම වෙනුවට මෙවන් ක්ෂේත්‍රයක් තුළ තම ජීවිතය හැඩගස්වා ගැනීමට ඇති හැකියාව පිළිබඳ අවධානය යොමු විය යුතු කාලය එළඹ ඇත. වෘත්තියක් ලෙස හෝ විනෝදාංශයක් ලෙස මෝස්තර නිරූපණය තෝරා ගැනීමට බලාපොරොත්තු වන තරුණ ඔබට, මෙම ආයතනය හෝ මෙම ක්ෂේත්‍රය පිළිබඳ නිවැරදි දැනුම ලබා දෙන වෙනත් ආයතනයක් වෙතින් දැනුම ලබා ගැනීම තුළින් වඩා අවබෝධයකින් යුතුව, සාර්ථක නිරූපණ ශිල්පියෙක්/ ශිල්පිනියක් ලෙස ක්ෂේත්‍රය තුළ දීර්ඝ ගමනක ආරම්භය සනිටුහන් කිරීමට හැකි වනවා නිසැකයි.

# රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශයේ වැඩසටහන්

**මෙම වැඩසටහන් සඳහා සහභාගී වීමට කැමතිනම් ඔබගේ විස්තර ඇතුළත් අයදුම්පතක් පහත ලිපිනයට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි පිහිටි වෘත්තීය මාර්ගෝපදේශ මධ්‍යස්ථාන වෙත බාර දෙන්න.**

- වෘත්තීය අභියෝග ජය ගැනීමේ වැඩසටහන
- පාසල් සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්
  - උසස් පෙළ සිසුන් සඳහා
  - සාමාන්‍ය පෙළ සිසුන් සඳහා
  - සාමාන්‍ය පෙළින් පසු සිසුන් සඳහා
- උපාධි අපේක්ෂකයින් සඳහා 'ඔබ අසිරිමත්ය' වැඩ සටහන
  - අභ්‍යන්තර සිසුන් සඳහා
  - බාහිර සිසුන් සඳහා
- ගුරුවරුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන
- ස්වයං රැකියා ඇරඹීම සඳහා පෙළඹවීමේ වැඩසටහන
- රැකියා පොළ සහ ස්වයං රැකියා අත්වැල වැඩසටහන
  - ප්‍රාදේශීය මට්ටමින්
  - දිස්ත්‍රික් මට්ටමින්
- වෘත්තීය මංපෙත් හඳුන්වා දීමේ වැඩසටහන
- වෘත්තීය උපදේශන සේවා ලබාදීම
- පෞද්ගලික අංශයේ රැකියාගත කිරීමේ වැඩසටහන
- නිදහස් රැකියා සඳහා පෙළඹවීමේ වැඩසටහන
- රැකියා සමාජ වැඩසටහන
- ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන
- ව්‍යවසායකත්ව අවශ්‍යතා මත පුහුණු වැඩසටහන




**රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය,**
**මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව**
**කම්කරු අමාත්‍යාංශය**

09 වන මහල, 'සෙත්සිරිපාය', දෙවන අදියර, බත්තරමුල්ල.
හසර මධ්‍යස්ථානය : 0112-186167
දුරකථනය : 0112-187134




රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය,
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
කම්කරු අමාත්‍යාංශය
09 වන මහල, 'සෙත්සිරිපාය', දෙවන අදියර, බත්තරමුල්ල.
හසර මධ්‍යස්ථානය : 0112-186167
දුරකථනය : 0112-187134